# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# இலங்கை பௌத்த பாளி பல்கலைக்கழகம்
# BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA



# වාර්ෂික වාර්තාව 2022

# අපගේ දැක්ම

**ලෝකයේ ප්‍රමුඛ වූ ද,**

**විශිෂ්ටතම වූ ද,**

**බෞද්ධ විශ්වවිද්‍යාලය බවට**

**පත්වීම.**

# මෙහෙවර ප්‍රකාශය
# (ධම්මචක්කං පවත්තෙතුං)

**බුද්ධ ධර්මය, පාලි භාෂාව හා තදනුබද්ධ විෂය**

**ඥානයෙන් ශික්ෂිත,**

**විවිධ කුශලතාවන්ගෙන් පරිපූර්ණ,**

**තථාගත ධර්මයෙන් විශද වන**

**ජීවන දර්ශනය ශ්‍රී ලංකාවෙහි මෙන් ම විදේශයන්හි ද**

**ප්‍රවර්ධනය කොට**

**පෝෂණය කිරීමට සමත්,**

**බහුශ්‍රැත ධර්මදූතයන් හා ශාස්ත්‍රධරයන්**

**ලොවට දායාද කිරීම.**

## ගෞරවාර්හ මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි ද බුද්ධ ධර්මය හා ඉන් ප්‍රකට කෙරෙන ජීවන දර්ශනය පිළිබඳ ශාස්ත්‍රධරයන් බිහිකිරීම අරමුණු කොට 'ධම්මචක්කං පවත්තෙතුං' යන ශ්‍රේෂ්ඨ බුද්ධ වචනය ආදර්ශ පාඨය ලෙස යොදාගනිමින් බුදුරදුන්ගේ දහම් පණිවිඩය ලොවට පැහැදිලි කරදීම සඳහා 1984 අංක 74 දරන පනතින් හා 1995 අංක 37 දරන සංශෝධන පනතින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිහිටුවා තිබේ.

ආරාමික පරිසරයක් තුළ භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපනය ලබාදීම සඳහා මහාචාර්ය වල්පොල රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මාර්ගෝපදේශය යටතේ මාලිගාකන්දේ විද්‍යෝදය ආයතනය, බලගල්ලේ සරස්වතී ආයතනය, පින්වත්තේ සද්ධර්මාකර ආයතනය හා පැලියගොඩ විද්‍යාලංකාර ආයතනය මගින් විශ්වවිද්‍යාලයේ පාඨමාලා ක්‍රියාත්මක කරන ලදී. පරිපාලන කටයුතු සිදුකරන ලද්දේ කොළඹ 07 බෞද්ධාලෝක මාවත අංක 214 හි ස්ථාපිත ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගිනි. අනතුරුව ප්‍රතිව්‍යුහගත කොට හෝමාගම පරිශ්‍රයේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලදී. වර්ෂ හතළිහක කාල පරාසය තුළ මෙම විශ්වවිද්‍යාලය බෞද්ධ අධ්‍යයන පීඨය, භාෂා අධ්‍යයන පීඨය හා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ තුනකින් ද අධ්‍යයන අංශ 10 කින් ද සංවර්ධනය වී ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලය 49කින් ද අනධ්‍යයන කාර්යමණ්ඩලය 125 දෙනෙකුගෙන් ද සමන්විත වන අතර අභ්‍යන්තර උපාධි සඳහා ගිහි පැවිදි සිසුහු 610 ක් ලියාපදිංචි වී සිටිති. පශ්චාද් උපාධි හා බාහිර විභාග සඳහා 3700 කට ආසන්න විද්‍යාර්ථීන් ලියාපදිංචිව සිටින අතර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අනුබද්ධ විදේශීය ආයතන 13 ක් සිංගප්පූරුව, ජපානය, මැලේසියාව, බංගලාදේශය, ඔස්ට්‍රියාව, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය යන රටවල ආරම්භ කර ඇති අතර විවිධ ජාතික විද්‍යාර්ථීහු රැසක් මේවායේ බුද්ධධර්මය, පාලි භාෂාව හා තදනුබද්ධ විෂයයන් පිළිබඳව අධ්‍යාපනය ලබති.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන එනු ලබන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල පර්ෂදයේ සාමාජිකත්වය ද ලබා ඇත.

රාජ්‍ය ආයතන සම්බන්ධ හොඳම පාලන වාර්තාව පිළිබඳ පළමු ස්ථානය 2018 වර්ෂයේ ලබා ඇති මෙම විශ්වවිද්‍යාලය 2019 පාලන වාර්තාව සඳහා ද තුන්වන ස්ථානය හිමිකර ගෙන ඇත.

ථෙරවාදී ශාසනික සම්ප්‍රදායට අනුගත වෙමින් විශ්වවිද්‍යාලයේ කුලපති ධුරය මහා මහෝපාධ්‍යාය ලෙසද උප කුලපති ධුරය මහෝපාධ්‍යාය යනුවෙන් ද නම්කර ඇති අතර විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ කාර්යභාර්ය වී ඇත්තේ බුද්ධාගම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කරලීමයි.

වර්තමාන ලෝක තත්වයන්ට ගැලපෙන ලෙස බුදුරජාණන් වහන්සේගේ දහම් පණිවිඩය ලොව පුරා ව්‍යාප්ත කරලීමෙහි ලා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය වෙත පැවරී ඇති කාර්ය්‍යභාර්ය සුවිශාලය. ඒ සඳහා මේ වන විටත් අප විසින් දරන ලද ප්‍රයත්නයන්හි සාර්ථක ප්‍රතිඵල ලෙස ලොව පුරා අනුබද්ධ ආයතන පිහිටුවා ඇති අයුරින් ප්‍රකට වේ. එසේම ආදි විද්‍යාර්ථීන් ලොව විවිධ රටවල්වලට ගොස් විහාරස්ථාන පිහිටුවා ධර්ම ප්‍රචාරක කටයුතු වල නියැලීමෙන් සිදුකරන ශාසනික කාර්යභාරයන්ගෙන් ප්‍රකට කෙරේ. පසුගිය දශක හතරකට ආසන්න කාලයක් තුළ උපාධිධාරීන් දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් සමාජයට දායාද කර ඇති මෙම විශ්වවිද්‍යාලය ලක්දිව සියලු විහාරස්ථානයන්හි එක් භික්ෂූන්වහන්සේ නමක් හෝ බුද්ධ ධර්මය, පාලි භාෂාව සම්බන්ධ විෂයයන්ගෙන් උසස් අධ්‍යාපනය ලබා ඇති සමාජය පිළිගත් උගතුන් බවට පත්කර තිබේ. දහම් සරසවිය මගින් දිවයිනේ දහම් පාසල් ගුරුවරුන් රාශියකට නව දැනුම වර්ධනය කර ගැනීමට මාර්ගෝපදේශ ලබා දී ඇත.

දිවයිනේ සෙසු විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව නියාමනය වුව ද මෙම විශ්වවිද්‍යාලය වෙනම පනතකින් පිහිටුවා ඇති ස්වාධීන ආයතනයක් වන අතර රජයේ සෙසු විශ්වවිද්‍යාලයන්ට හිමිවන සියලු අයිතීන් හා වරප්‍රසාද පිළිබඳව හිමිකම් ඇත.

ශ්‍රී ලංකාව පාලි විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අටුවා ටීකා සම්පාදනය කරමින් සිදුකර ඇති අවාච්‍ය සේවාව අගය කරමින් ශ්‍රී ලංකා බෞද්ධ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය යනුවෙන් නම් කළ බව මෙහි නිර්මාතෘ මහාචාර්ය වල්පොල රාහුල හිමියන් විසින් වාර්තා කර ඇත. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන ශිෂ්‍ය ප්‍රමාණයෙන් 2/3 භික්ෂූන් වහන්සේලා ද 1/3 ගිහි සිසුන්ගෙන් ද සමන්විත වන අතර සියලු සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ද සලස්වා ඇත.

සම්බුද්ධ ශාසනය රඳා පවතින්නේ විනය මතය. විනය නොමැති වූ විටක දී බුදුසසුන පිරිහී යයි. විනයානුකූල ප්‍රතිපත්ති ගරුක භික්ෂු පිරිසක් ලොවට දයාද කරදීමට සුවිශාල ප්‍රයත්නයක් දැරීමට මෙම විශ්වවිද්‍යාලයට සිදුව තිබේ. භාරත දේශයේ ප්‍රතිෂ්ඨාපිතව තිබූ නාලන්දා, ජගද්දලා, තක්ෂිලා වැනි බෞද්ධ විශ්වවිද්‍යාලයන් මගින් සිදුකළ කාර්යභාරය ශ්‍රී ලංකාවතුළ ඉටුකිරීමට අවශ්‍ය ශක්තිය ලබාදීම හා ලබාගැනීමට අදාළ සියලු පාර්ශ්වයන්හි ප්‍රමුඛතම කාර්යයන් වේ.

බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම සඳහාත් ධර්මදූත සේවාවන් දේශීය මෙන්ම ජාත්‍යන්තරව ද සිදු කිරීමට අවශ්‍ය වන හෙයින් සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ, ප්‍රංශ, කොරියන්, චීන, ජපන්, හින්දි භාෂා උපාධි මට්ටමින් මෙන්ම සහතික පත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා මට්ටමින් හැදෑරීමට අවස්ථා සලස්වා තිබේ.

තථාගත බුද්ධ වචනය සියලු සීමාවන් ඉක්මවා ගොස් දිනෙන් දින අළුත් වන සඳක් සේ විවෘත වූ තරමටම බබලන්නකි. විශ්වය හා සත්වයා පිළිබඳ යථාභූත සත්‍ය ලොවට පහදා දීම ගිනිගෙන දැවෙමින් පවත්නා ලෝකය සිසිල් මෙන්ම නිවුනු බවට පත්කරන්නකි. යාවනිබ්බාණ අධ්‍යාපනයක් වන බෞද්ධ අධ්‍යාපනය 21 වන ශතවර්ෂයට යෝග්‍ය වන පරිදි ලබාදීම අපගේ ප්‍රයත්නය වේ.

බුදුදහම පෝෂණය කොට සුරක්ෂිත කිරීමේ රාජ්‍ය වගකීම අනුව පෙරටම යන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර අනුව ලෝකයා අපේක්ෂාවෙන් සිටින යුග කාර්යභාරය ඉටු කිරීමට ඔබ හැමට ශක්තිය, ධෛර්‍ය හා වාසනාව, ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණානුභාව බලයෙන් ලැබේවායි ආශංසනය කරම්හ.

මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ (ධුරයේ කාර්යයන් ඉටුකරන)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**මාතෘකාව** **පිටු අංකය**


1. ගෞරවාර්හ මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය ---------- -2-3
2. පටුන ---------- 4-5
3. හැඳින්වීම ---------- 6
4. විශ්වවිද්‍යාලයේ අරමුණු ---------- 7
5. විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලය ---------- 8
6. සනාතන සභාව ---------- 9-10
7. පනත ප්‍රකාරව - විශ්වවිද්‍යාලයේ නිලධරයෝ ---------- 111
8. 2022 වර්ෂයේ පැවති කමිටු සහ වාර ගණන ---------- 12
   විගණන හා කළමනාකරණ කමිටුව ---------- 12
   මුදල් කමිටුව ---------- 12
   ආයතනික ප්‍රසම්පාදන කමිටුව හා සුළු ප්‍රසම්පාදන කමිටුව ---------- 12
   - පීඨ මණ්ඩල ---------- 12
   - ශිෂ්‍ය සුභ සාධන කමිටුව ---------- 12
   - පරිපාලන නිලධාරී රැස්වීම් ---------- 12
   - අධ්‍යයන නිවාඩු කමිටුව ---------- 12
9. ප්‍රගතිය ---------- 13
10. අනාගත සැලසුම් (Future Plans) ---------- 14-15
11. විශ්වවිද්‍යාලයේ සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර - 2022 ---------- 16
12. දේශීය සිසුන් පිළිබඳ විස්තර ---------- 17
13. විදේශීය සිසුන් පිළිබඳ විස්තර ---------- 17
14. පාඨමාලා සඳහා බඳවා ගත් විදේශීය විද්‍යාර්ථීන් ---------- 18
15. උපාධි සඳහා ලියාපදිංචි සිසුන් ---------- 19-20
16. 2013 වසරේ සිට 2022 වසර දක්වා උපාධි ලබා ගත් විද්‍යාර්ථීන් ---------- 21
17. උපාධිය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව ---------- 22
18. විභාග හා අධ්‍යයන කටයුතු ---------- 23
19. ශිෂ්‍යත්ව සඳහා හිමිකම් ලබන සිසුන් ---------- 23-24
20. අධ්‍යයන කාර්ය මණ්ඩලය ---------- 24-25
21. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - 2022..12.31 ---------- 26
22. බාහිර කථිකාචාර්යවරුන් පිළිබඳ විස්තර ---------- 26
23. පර්යේෂණ සහ ප්‍රකාශන පිළිබඳ විස්තර ---------- 27
24. පුස්තකාලය පිළිබඳ තොරතුරු ---------- 27-29

25. පීඨ ---------------------------------------- 30-34
26. ඵලදායිතා මිනුම් (KPI) ---------------------------------------- 35
27. මානව සම්පත් ---------------------------------------- 36
28. පරිපාලන කාර්ය මණ්ඩලය---------------------------------------- 37-39
29. අභ්‍යාසලාභීන් බඳවා ගැනීම ---------------------------------------- 40
30. වාහන උපයෝජනය---------------------------------------- 40
31. උපකරණ උපයෝජනය ---------------------------------------- 41
32. විශ්වවිද්‍යාලයේ වැඩ සිටි මහෝපාධ්‍යායයන් වහන්සේලා ---------------------------------------- 42-43
33. රැස්වීම් පිළිබඳ දින දර්ශනය ---------------------------------------- 44-45
34. ඒක ශිෂ්‍ය පිරිවැය---------------------------------------- 46
35. 2022 වර්ෂයේ ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම් ---------------------------------------- 47-49
36. 1988 සිට 2022 දක්වා විශ්වවිද්‍යාලයට වෙන් වූ ප්‍රතිපාදන---------------------------------------- 50
37. මූලධන වියදම් 2022---------------------------------------- 51
38. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ---------------------------------------- 52
39. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව ---------------------------------------- 52-54
40 විදේශීය අනුබද්ධායතන - 2022 ---------------------------------------- 55
41. විශ්වවිද්‍යාල සංවිධාන ධුරාවලිය---------------------------------------- 56
42. ආයතනික තොරතුරු---------------------------------------- 57
43. අවසාන ගිණුම්---------------------------------------- 58-90
44. සේවක අර්ථසාධක අරමුදල ගිණුම්---------------------------------------- 91-98
45. විගණකාධිපති වාර්තාව---------------------------------------- 99-111
46. විගණකාධිපති වාර්තාව සේවක අර්ථසාධක අරමුදල---------------------------------------- 112-117

## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1981 අංක 74 දරන පාර්ලිමේන්තු පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 1982 අප්‍රේල් මස 22 වෙනි දින කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 214 යන ස්ථානයෙහි උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදි. බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම, ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම හා අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සඳහා පහසුකම් සැලැස්වීම මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වේ.

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත මගින් යථෝක්ත පනත සංශෝධනය කොට ඇත. එකී සංශෝධන ක්‍රියාත්මක වීමත් සමඟ මෙතෙක් පැවති දේශීය අනුබද්ධායතන අහෝසි වී ඇති අතර, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි ව්‍යුහයට අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කොට 1997 ජූනි මස හෝමාගම දී ද, විශ්වවිද්‍යාලයේ බාහිර විභාග හා පශ්චාද් උපාධි අධ්‍යයන මධ්‍යස්ථානය කොළඹ 7, බෞද්ධාලෝක මාවත පරිශ්‍රයේ ද, නේවාසිකාගාර සහිත ව අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිටිපන ද, පරිපාලන මධ්‍යස්ථානය අංක 37, මොරගහහේන පාර, පිටිපන ද 2010.08.12 දින ස්ථානගත කොට ඇත. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සකලාංග සම්පූර්ණ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට අවශ්‍ය මූලික විධිවිධාන දැනටමත් සම්පාදනය කොට තිබේ. පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය ද දරන අතර, මෙරට විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ Committee of Vice Chancellors and Directors (C.V.C.D.) හි ආශ්‍රිත සාමාජිකත්වය හිමිව ඇති ජාත්‍යන්තර කීර්තිමත් ආයතනයකි.

## විශ්වවිද්‍යාලයේ අරමුණු

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනතේ විධිවිධාන අනුව ප්‍රතිව්‍යුහගත විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වේ.

I. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම ;

II. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාලි භාෂාව, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයට ගැළපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම ;

III. (අ) පිරිවෙන්වල, පාසල්වල සහ ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණුකිරීම ;

(ආ) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සියලුම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වාගෙන යාම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම ; සහ

(ඇ) ඉහත සඳහන් කාරණා කිසිවක් සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණා.

**විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලය**
**පාලක සභාව ඃ-**

**01. මහෝපාධ්‍යායයන් වහන්සේ :**

මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස ස්වාමීන් වහන්සේ - ධුරයේ කාර්යයන් ඉටුකරන (2020.11.02 සිට)

**02. පීඨාධිපතිවරු :**
**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන ස්වාමීන් වහන්සේ
**භාෂා අධ්‍යයන පීඨාධිපති**
මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ (2022.01.25 සිට 2022.05.31)
මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ - වැඩ බලන (2022.07.01 සිට 2022.11.25)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා - පීඨාධිපති භාෂා අධ්‍යයන පීඨය (2022.12.22 සිට)
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨාධිපති**
මහාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන ස්වාමීන් වහන්සේ

**03. සනාතන සභා සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගත් සාමාජිකයන් :**
මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2021.10.22 සිට)

**04. බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නාමිකයා :**
බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නාමිකයා
මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා (2022.01.25 සිට 2022.03.29 දක්වා) - බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
සෝමරත්න විදානපතිරණ මහතා (2022.05.31 සිට) ලේකම් - බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

**05. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නාමිකයා :**
ටී. කේ. ඩබ්. ටී. පී. ප්‍රේමරත්න මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂක (ශිෂ්‍ය ණය අංශය) - අධ්‍යාපන අමාත්‍යාංශය

**06. විෂය භාර ගරු ඇමතිතුමා විසින් පත් කළ සාමාජිකයන් :**
- ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ගෞරවාර්හ තිරිකුණාමලේ ආනන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- සාහිත්‍ය චක්‍රවර්ති ආචාර්ය පූජ්‍ය නියන්ගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- පූජ්‍ය නැදගමුවේ විජයමෛත්‍රී අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විමල් විජේරත්න මහතා
- මහාචාර්ය කේ. ඒ. වීරසේන මහතා
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා
- නීතිඥ කළ්‍යානන්ද තිරාණගම මහතා
- ජනාධිපති නීතිඥ ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා

**07. පාලක සභාවේ ලේකම් :**

ආර්.ඒ. පියරත්න මහතා (ලේඛකාධිකාරි) - (2022.01.25 සිට 2022.03.29 දක්වා)

ඊ.ඒ. ගුණසේන මහතා (ලේඛකාධිකාරි - වැඩ බලන) - 2022.05.31 දින සිට

**පාලක සභා රැස්වීම් පැවැත් වූ වාර ගණන :**
2022 වර්ෂය සඳහා පාලක සභාව පැවැත්වූ වාර ගණන - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සභා වාර 11ක් පවත්වා ඇත.

**සනාතන සභාව**

**01. මහෝපාධ්‍යායයන් වහන්සේ :**

මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස ස්වාමීන් වහන්සේ - ධුරයේ කාර්යයන් ඉටුකරන (2020.11.02 සිට)

**02. පීඨාධිපතිවරු :**

**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉලුකේවෙල ධම්මරතන ස්වාමීන් වහන්සේ (2021.07.17 සිට)

**භාෂා අධ්‍යයන පීඨාධිපති**
මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ - 2022.01.08 සිට 2022.05.26 දක්වා
මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ - 2022.06.21 සිට 2022.12.20 දක්වා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා - (2022.12.22 සිට)

**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨාධිපති**
මහාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන ස්වාමීන් වහන්සේ

**03. අධ්‍යයනාංශ ප්‍රධානීහු :**

මහාචාර්ය පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන් වහන්සේ
(බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශාධිපති)
මහාචාර්ය නිලන්ත පී. දිසානායක මහතා (2022.01.08 සිට 2022.11.15 දක්වා)
මහාචාර්ය නිලන්ත පී. දිසානායක මහතා (2022.12.20 සිට)
(බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශාධිපති)
විශ්‍රාමික මහාචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ
(සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය බැරගම සද්ධානන්ද ස්වාමීන් වහන්සේ
(පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන් වහන්සේ (2022.01.11 දින පමණි)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය කොටියාගල උපරතන ස්වාමීන් වහන්සේ (2022.02.08 දින සිට)
(පාලි භාෂා අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද ස්වාමීන් වහන්සේ (2022.01.08 සිට 2022.05.26 දක්වා)
මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ (2022.06.21 සිට)
(සංස්කෘත අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඒ.එල්.එන්.පී. පෙරේරා මහත්මිය
(සිංහල භාෂා අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය වරුණි තෙන්නකෝන් මහත්මිය
(ඉංග්‍රීසි අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිරෝෂා සල්වතුර මහත්මිය (2022.01.11 සිට 2022.11.15 දක්වා)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඊ.ජී. ඉන්දීවරී පූර්ණිමා වික්‍රමසිංහ මහත්මිය (2022.12.20 සිට)
(භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශාධිපති)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා
(ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශාධිපති)

**04. පුස්තකාලයාධිකාරී**

මනෝරි සමරකෝන් මහත්මිය (වැඩබලන පුස්තකාලයාධිකාරී)

**05. පීඨ නියෝජිත :**

**භාෂා අධ්‍යයන පීඨය**
කථිකාචාර්ය (ස්ථිර නොකළ) ආචාර්ය පූජ්‍ය පදියතලාවේ අමරවංශ හිමි

**බෞද්ධ අධ්‍යයන පීඨය**
කථිකාචාර්ය (ආධුනික) කේ.ආර්. සුපුන් කළුආරච්චි මහතා

ඩබ්.පී.එල්. මිහිරාණි නිලූෂිකා මිය - උපදේශිකා, බෞද්ධ උපදේශනය

**06. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/මහාචාර්ය**

මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ
මහාචාර්ය යමුනා හේරත් මහත්මිය
මහාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය
මහාචාර්ය පූජ්‍ය අලුත්ගම විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ
මහාචාර්ය සස්නි අමරසේකර මහත්මිය

**07. පත් කරන ලද සාමාජිකයන් :**

මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස ස්වාමීන් වහන්සේ
මහාචාර්ය පූජ්‍ය එළමල්දෙණියේ සාරානන්ද ස්වාමීන් වහන්සේ
මහාචාර්ය උඩුහාවර ආනන්ද ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය දෙණියායේ පඤ්ඤාලෝක ස්වාමීන් වහන්සේ
මහාචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ මහතා

**08. සනාතන සභාවේ ලේකම් :**

ආර්.ජී. පියරත්න මහතා (ලේඛකාධිකාරි) - (2022.01.25 සිට 2022.03.29 දක්වා)

ජී.ජී. ගුණසේන මහතා (ලේඛකාධිකාරි - වැඩ බලන) - 2022.05.31 දින සිට

**සනාතන සභා රැස්වීමේ පැවැත් වූ වාර ගණන :**

2022.01.14 දින සිට 2022.12.08 දින දක්වා රැස්වීම් වාර 10ක් පවත්වා ඇත.

## පනත ප්‍රකාරව - විශ්වවිද්‍යාලයේ නිලධරයෝ

**1. මහා මහෝපාධ්‍යාය ධුරය**

ශ්‍රී ලංකා සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය අග්ගමහා පණ්ඩිත ශාස්ත්‍රපති මකුලෑවේ විමල මාහිමිපාණන් වහන්සේ - 2022.01.17 දින සිට

**2. මහෝපාධ්‍යායයන් වහන්සේ**

මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2020.11.02 දින සිට)
(ධුරයේ කාර්යයන් ඉටුකරන)

**3. බෞද්ධ අධ්‍යයන පීඨාධිපති**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන ස්වාමීන් වහන්සේ

**4. භාෂා අධ්‍යයන පීඨාධිපති**

මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ - 2022.06.21 සිට 2022.12.20 දක්වා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා - (2022.12.22 සිට)

**5. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨාධිපති**
මහාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන ස්වාමීන් වහන්සේ

**6. ලේඛකාධිකාරි**

ආර්.ඒ. පියරත්න මහතා (ලේඛකාධිකාරි) - (2022.01.25 සිට 2022.03.29 දක්වා)

ඊ.ඒ. ගුණසේන මහතා (ලේඛකාධිකාරි - වැඩ බලන) - (2022.05.31 දින සිට)

**7. පුස්තකාලයාධිකාරී**

මනෝරි සමරකෝන් මහත්මිය (වැඩබලන පුස්තකාලයාධිකාරී)

**8. මූල්‍යාධිකාරී**

එම්.ඒ.වී.එස්. ගුණවර්ධන මහතා

## 2022 වර්ෂයේ පැවති කමිටු සහ වාර ගණන

### විගණන හා කළමනාකරණ කමිටුව

2022 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 04 කි.

### මුදල් කමිටුව

2022 වර්ෂය සඳහා මුදල් කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 06 කි.

### ආයතනික ප්‍රසම්පාදන කමිටුව හා සුළු ප්‍රසම්පාදන කමිටුව

2022 වර්ෂය සඳහා ආයතනික ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 05 කි.

2022 වර්ෂය සඳහා සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 14 කි.

### සනාතන සභා ස්ථාවර කමිටුව

2022 වර්ෂය සඳහා සනාතන සභා ස්ථාවර කමිටු වාර 05ක් පවත්වා ඇත.

### පීඨ මණ්ඩල

සංශෝධිත පනතෙහි විධිවිධාන අනුව පීඨ මණ්ඩල දෙකක් පිහිටුවා ඇත.

ඒ අනුව 2022 වර්ෂයේ පැවැත්වූ එක් එක් පීඨයේ පීඨ මණ්ඩල වාර ගණන පහතින් දැක්වේ.

7.1 බෞද්ධ අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් පැවැත් වූ වාර ගණන - 11

7.2 භාෂා අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් පැවැත් වූ වාර ගණන - 12

7.3 පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් පැවැත් වූ වාර ගණන - 12

### ශිෂ්‍ය සුභසාධන කමිටුව

ශිෂ්‍ය සුභසාධන කමිටු රැස්වීම් පැවැත් වූ වාර ගණන - 01

### පරිපාලන නිලධාරී රැස්වීම්

මහෝපාධ්‍යායයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සෑම අංශ ප්‍රධානියෙකුගේම සහභාගීත්වයෙන් මාසයකට වරක් පවත්වනු ලබන මෙම රැස්වීමේ දී අංශවල පරිපාලන ගැටලු හා යෝජනා පිළිබඳ සාකාච්ජා කරනු ලැබේ.

2022 වසර තුළ පැවැත්වූ රැස්වීම් වාර ගණන 04 කි.

### අධ්‍යයන නිවාඩු කමිටුව

අනු කමිටුවක් වූ අධ්‍යයන නිවාඩු කමිටුව 2022 වසර තුළ පැවැත්වූ රැස්වීම් වාර ගණන 06 කි.

## ප්‍රගතිය

### පශ්චාද් උපාධි හා බාහිර පාඨමාලා

- **මුළු බාහිර පාඨමාලා හදාරන මුළු විද්‍යාර්ථීන් ගණන 4949 කි.**

### විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

01. අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීම. දෙවන අදියර මිලියන - 150

02. ආගන්තුක නිවාසයක් ඉදිකිරීම

03 .කොළඹ කාර්යාලයේ පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

04. විදේශීය සිසුන් 200 සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම

05. බෞද්ධාලෝක මාවතේ පිහිටි පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ පිහිටි තෙමහල් ගොඩනැගිල්ල පාඨමාලා පැවැත්වීමට උචිත පරිදි ප්‍රතිසංස්කරණය කිරීම

06. අකුණු සන්නායක පද්ධතියක් ඉදකීි රිම

07. විශ්වවිද්‍යාලීය ජාලගතකරණය හා නඩත්තුව

08. ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල අලුත්වැඩියාව

09. පීඨ පරිපාලන ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව සහ තීන්ත ආලේප කිරීම (ආපන ශාලාව ද ඇතුළුව)

10. පුස්තකාලයේ නවීකරණ කටයුතු

11. කාර්ය මණ්ඩල ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානය ඉදිකිරීම

12 .සරසවි මැඳුර නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම.

13. උද්‍යාන අලංකරණය අක්කර දෙකක ඉඩම

14. චිත්තාභ්‍යාස මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ ඉඩම පවරා ගැනීම

15. සූර්ය බලශක්ති ජනකය

16. හරිතකරණය සඳහා

17. අපවිත්‍ර ජලය පවිත්‍ර කිරිමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම

18. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීම

19. නේවාසිකාගාර පාලක නිල නිවාසයක් ඉදි කිරීම

20. නේවාසිකාගාර උප පාලක නිල නිවාසය III ඉදි කිරීම

**අනාගත සැලසුම් (Future Plans)**

- පංචවිධ සංකල්පය විශ්වවිද්‍යාලය තුළ ඇති කිරීමට අදාළව විශ්වවිද්‍යාලයේ අංශ අතර ඵලදායීතාවට අදාළව තරඟ ඇති කිරීම.
- විදේශීය අනුබද්ධායතන මගින් නව විෂය ධාරාවන් යටතේ ආකර්ෂණීය පාඨමාලා හඳුන්වා දීම.
- නායකත්ව පුහුණු වැඩමුළු හා ව්‍යාපෘති ඇරඹීම.
- බෞද්ධ මනෝවිද්‍යා උපදේශන මගින් ශිෂ්‍යයන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම.
- ශිෂ්‍යයන්ගේ තාක්ෂණික, සන්නිවේදන, නායකත්වය හා භාෂාමය කුසලතාවන් වැඩිදියුණු කිරීමට අදාළ ව්‍යාපෘති
- අධ්‍යයන, පරිපාලනමය හා අනධ්‍යයන කාර්යමණ්ඩලවල වෘත්තීමය කුසලතාවන් වැඩිදියුණු කිරීමට අදාළ ව්‍යාපෘති
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල දේශීය/විදේශීය පුහුණුවීම් සඳහා යොමු කිරීම.
- නව අධ්‍යයනාංශ හා පීඨ ආරම්භ කිරීමේ අරමුණින් නව පාඨමාලා හඳුන්වා දීම.
- වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් ඉහළ දැමීම.
- පවත්නා පාඨමාලා යාවත්කාලීන කිරීම හා ගෝලීය ප්‍රවණතාවලට අදාළ නව පාඨමාලා හඳුන්වා දීම.
- ප්‍රකට විද්වතුන්ගේ හා සම්පත් දායකයන්ගේ විශේෂ දේශන සංවිධානය කිරීම.
- ක්ෂේත්‍ර අධ්‍යයන, පුරාවිද්‍යාත්මක ගවේෂණ සඳහා ශිෂ්‍යයන් වැඩි වශයෙන් යොමු කිරීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය කුසලතා සංවර්ධනයට පහසුකම් ලබා දීම.
- පර්යේෂණ පත්‍රිකා හා අනෙකුත් ශාස්ත්‍රීය කටයුතු සඳහා සිසුන් වැඩි වශයෙන් යොමු කිරීම.
- අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන හා ශිෂ්‍යගත කණ්ඩායම්වල සහභාගීත්වයෙන් සමාජ සුභසාධන වැඩසටහන් සංවිධානය
- විශ්වවිද්‍යාලයේ සියලුම අංශ පරිගණකගත කිරීම සඳහා ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය හා එක්ව කටයුතු කිරීම
- සිතියම්කරණය, ඡායාරූපකරණය හා සැලසුම්කරණය ආදී ප්‍රායෝගික විෂයයන් සඳහා අවශ්‍ය ඒකකයක් (Cartography Unit) ස්ථාපනය කිරීම.
- අධ්‍යාපනවේදී (B.Ed) උපාධිය ආරම්භ කිරීම මගින් පිරිවෙන් හා පාසල් සඳහා පුහුණු ගුරුවරුන් ලෙස බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් යොමු කිරීම.
- බෞද්ධ අධ්‍යයන පීඨය යටතේ ඇති සෑම විෂයකින්ම ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කිරීම.
- මාර්ගගත ක්‍රමවේදය හා දුරස්ථ ක්‍රමවේදය ඔස්සේ නව බාහිර පාඨමාලා හඳුන්වා දීම.
- නව විදේශීය අනුබද්ධායතන ඇති කිරිමට පියවර ගැනීම
- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, නායකත්ව හා කුශලතාවන් වැඩි දියුණු කිරීමට අදාළ ව්‍යාපෘති ආරම්භ කිරීම.
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුවීම්වලට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ආචාර්යවරුන්ගේ ශාස්ත්‍රීය කුසලතා සංවර්ධනයට පහසුකම් ලබා දීම.
- අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් එක්ව සාකච්ඡා පවත්වමින් සිසුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනයට අවශ්‍ය පියවර ගැනීම.
- සමාජ සුභසාධන වැඩසටහන් සංවිධානය කිරීම.
- පුරාවිද්‍යා අධ්‍යයනාංශය යටතේ පවත්නා පුරාවිද්‍යා ශික්ෂණ කෞතුකාගාරය නිසි පරිදි ඉදිකිරීමට අවශ්‍ය මූල්‍ය සහ යටිතල පහසුකම් ලබා ගැනීම
- අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා ලබා දී තිබෙන ආකාරයට ක්ෂේත්‍ර පුරාවිද්‍යාත්මක කටයුතු සිදු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර භූමියක් අප විශ්වවිද්‍යාලය සඳහා ද ලබා ගැනීම.

## විශ්වවිද්‍යාලයේ සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර - 2022

| පවතින පීඨ | පාඨමාලාව | සිසුන් වර්ගීකරණය | | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය - **අභ්‍යන්තර** | බෞද්ධ අධ්‍යයන | දේශීය | 278 | 345 | 25 | |
| | | විදේශීය | 67 | | | |
| භාෂා අධ්‍යයන පීඨය - **අභ්‍යන්තර** | භාෂා අධ්‍යයන | දේශීය | 299 | 299 | 24 | |
| | | විදේශීය | - | | | |
| **එකතුව** | | | **644** | **644** | **49** | |
| **පුස්තකාලය** | | | | | **01** | |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි | දේශීය | 1036 | 1180 | **බාහිර ආචාර්ය වරුන්ගේ සේවය ලබාගනී.** | 121 |
| | | විදේශීය | 64 | | | |
| | | විදේශ අනුබද්ධායතන | 80 | | | |
| | එක් අවුරුදු/දෑවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | දේශීය | 86 | **89** | | |
| | | විදේශීය | 03 | | | |
| | | විදේශ අනුබද්ධායතන | | | | |
| | ආචාර්ය උපාධි පාඨමාලාව | දේශීය | 10 | **10** | | |
| | | විදේශීය අනුබද්ධායතන | 00 | | | |
| | දර්ශනපති උපාධි පාඨමාලාව | දේශීය | 13 | **13** | | |
| | | විදේශීය | 00 | | | |
| | | විදේශීය අනුබද්ධායතන | | | | |
| | බුද්ධ ධර්ම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | දේශීය | 85 | **156** | | |
| | | විදේශ අනුබද්ධායතන | 71 | | | |
| | පාලි ඩිප්ලෝමා/පාලි උසස් ඩිප්ලෝමා | දේශීය | 07 | **11** | | |
| | | විදේශ අනුබද්ධායතන | 04 | | | |
| | ජපන් සහතික පත්‍ර/ඩිප්ලෝමා | දේශීය | 50 | **85** | | |
| | කොරියන් සහතික පත්‍ර පාඨමාලාව | | 21 | | | |
| | සංස්කෘත ඩිප්ලෝමා | | 14 | | | |
| | ඉංග්‍රීසි ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | දේශීය | 78 | **78** | | |
| | | විදේශීය | 00 | | | |
| | දෙමළ භාෂා ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා පාඨමාලාව | දේශීය | 74 | **74** | | |
| | දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව | දේශීය | 00 | 00 | | |
| | | විදේශීය | 00 | | | |
| **එකතුව** | | | | **1696** | **50** | **121** |
| **මුළු එකතුව (අභ්‍යන්තර හා බාහිර)** | | | | **2340** | | |

## දේශීය සිසුන් පිළිබඳ විස්තර

### දේශීය සිසුන් අභ්‍යන්තර (ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව) - 2022

| අධ්‍යයන පීඨය | පාඨමාලාව | මාධ්‍යය | 2018/ 2019 සිව්වන වසර | 2019/ 2020 තෙවන වසර | 2020/ 2021 දෙවන වසර | 2021/ 2022 පළමු වසර |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය | බෞද්ධ අධ්‍යයන | සිංහල | 23 | 51 | 92 | 90 |
| | | ඉංග්‍රීසි | 4 | 12 | 3 | 4 |
| | **එකතුව** | | **27** | **63** | **95** | **94** |
| භාෂා අධ්‍යයන පීඨය | භාෂා අධ්‍යයන | සිංහල | 22 | 69 | 89 | 95 |
| | | ඉංග්‍රීසි | 02 | 03 | 12 | 6 |
| | **එකතුව** | | **24** | **72** | **101** | **101** |
| **මුළු එකතුව** | | | **51** | **135** | **196** | **195** |

## විදේශීය සිසුන් පිළිබඳ විස්තර

### විදේශීය සිසුන් අභ්‍යන්තර (ලියාපදිංචි සංඛ්‍යාව) - 2022

| අධ්‍යයන පීඨය | පාඨමාලාව | මාධ්‍යය | 2018/ 2019 සිව්වන වසර | 2019/ 2020 තෙවන වසර | 2020/ 2021 දෙවන වසර | 2021/ 2022 පළමු වසර |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය | බෞද්ධ අධ්‍යයන | ඉංග්‍රීසි | 1 | 42 | 6 | 18 |
| භාෂා අධ්‍යයන පීඨය | භාෂා අධ්‍යයන | ඉංග්‍රීසි | - | - | - | - |
| **එකතුව** | | | **67** | | | |

**පාඨමාලා සඳහා බඳවා ගත් විදේශීය විද්‍යාර්ථීන්**

**අභ්‍යන්තර පාඨමාලා සඳහා බඳවා ගත් විදේශීය සිසුන් සංඛ්‍යාව (රට අනුව)**

| රට | **2018/ 2019** සිව්වන වසර | **2019/ 2020** තෙවන වසර | **2020/ 2021** දෙවන වසර | **2021/ 2022** පළමු වසර |
|---|---|---|---|---|
| බංග්ලාදේශය | 1 | 4 | 5 | 3 |
| මියන්මාරය | - | 32 | - | 15 |
| කාම්බෝජය | - | - | 1 | - |
| නේපාලය | - | 2 | - | - |
| චීනය | - | - | - | - |
| ඉන්දියාව | - | 3 | - | - |
| කොරියාව | - | 1 | - | - |
| **එකතුව** | **1** | **42** | **6** | **18** |

**විදේශීය රටවල පිහිටි අනුබද්ධායතනවල සිසුන් සංඛ්‍යාව**

| රට | 2022 වර්ෂයේ |
|---|---|
| සිංගප්පූරුව | 27 |
| මැලේසියාව | 10 |
| බංගලාදේශය | 03 |
| ඔස්ට්‍රියාව | 00 |
| ජපානය | 08 |
| **එකතුව** | 48 |

## උපාධි සඳහා ලියාපදිංචි සිසුන්
## 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂ සඳහා ලියාපදිංචි වී ඇති බාහිර ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු

| | | පාඨමාලාව | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | | බුද්ධ ධර්ම ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා | | | | | | | | | | |
| | | දේශීය | 375 | 295 | 229 | 254 | 195 | 79 | 57 | 36 | 47 | 47 |
| | | විදේශීය ආයතන | 85 | 102 | 93 | 138 | 08 | 70 | 104 | 66 | 49 | 71 |
| 2. | | පාලි ඩිප්ලෝමා | | | | | | | | | | |
| | | දේශීය | 50 | 33 | 28 | 39 | 38 | - | 15 | 27 | 20 | 21 |
| | | විදේශීය | | | | | | | 00 | 11 | 00* | 09 |
| 3. | | සංස්කෘත ඩිප්ලෝමා | | | | | | | | | | |
| | | දේශීය | 05 | 05 | 02 | 16 | 08 | 00 | 00 | 00 | 01 | 14 |
| 4. | | ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) | | | | | | | | | | |
| | | දේශීය | 543 | - | 3916 | 2566 | 2489 | 2610 | 2374 | 3246 | 1076 | 1036 |
| | | විදේශීය | 26 | 11 | 94 | 32 | 02 | 47 | 02 | 02 | - | 64 |
| | | විදේශීය ආයතන 56 | | | | | | | | | 51 | - |
| 5. | | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | | | | | | | | |
| | | දේශීය | 17 | 16 | 22 | 11 | 11 | 00 | 00 | 00 | 00 | - |
| | | විදේශීය ආයතන | 00 | 01 | 00 | 01 | 01 | 00 | 00 | 00 | 00 | - |
| 6 | ඉංග්‍රීසි ඩිප්ලෝමා | | | | | | | | | | | |
| | දේශීය | ඉංග්‍රීසි ඩිප්ලෝමා | 314 | 223 | 198 | 223 | 161 | 60 | - | 75 | 38 | 34 |
| | | උසස් ඩිප්ලෝමා සහතිකපත්‍ර පාඨමාලාව | 119 | - | 22 | 29 | 25 | 36 | - | 23 | 09 | 27 |
| | | සහතිකපත්‍ර පාඨමාලාව | 64 | - | 17 | - | 34 | 43 | - | 20 | 00 | - |
| | | උසස් සහතිකපත්‍ර පාඨමාලාව | | | | | | | | 37 | 09 | 17 |
| 7. | | ශාස්ත්‍රපති | | | | | | | | | | |
| | | එක් අවුරුදු/දෑවුරුදු ශාස්ත්‍රපති - දේශීය | 228 | 185 | 149 | 116 | 98 | 70 | 188 | 166 | 320 | 86 |
| | | විදේශීය | 43 | | | | | | 97 | 07 | 05 | 03 |
| | | විදේශීය ආයතන | | | | | | | | | 40 | |
| 8. | | දර්ශනපති | | | | | | | | | | |
| | | දේශීය | 12 | 12 | 20 | 31 | 30 | 23 | 114 | 22 | 120 | 13 |
| | | විදේශීය | 05 | 07 | 03 | - | 02 | 02 | 14 | 06 | 01 | - |
| | | විදේශීය ආයතන | ** | | | | | | | | 11 | |

| | | පාඨමාලාව | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 09 | | ආචාර්ය | | | | | | | | | | |
| | | දේශීය | 05 | 02 | - | 10 | 03 | 05 | 25 | 17 | 37 | 10 |
| | | විදේශීය | 02 | 00 | 00 | 00 | 00 | 00 | 01 | 02 | 06 | - |
| 10 | | බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව | 21 | 21 | 30 | 13 | 61 | 58 | 38 | 00 | 00* | - |
| 11 | | දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | | | | | | | | | | |
| | | උසස් ඩිප්ලෝමා පාඨමාලාව | | 36 | 35 | 36 | 28 | 20 | 32 | 17 | 50 | 23 |
| | | ඩිප්ලෝමා පාඨමාලාව | | | | | | 32 | 20 | 20 | 28 | 30 |
| | | සහතික පත්‍ර පාඨමාලාව | 17 | | 20 | - | 50 | 31 | 31 | 10 | 09 | - |
| 12 | | උසස් සහතික පත්‍ර පාඨමාලාව | 13 | | 09 | 09 | 17 | 16 | 16 | 12 | 10 | 21 |
| 13 | | දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව | - | 1806 | 1784 | 00 | 2054 | 2048 | 3813 | 2046 | 00* | - |
| 14 | | චීන සහතික පත්‍ර පාඨමාලාව | | | | | | | | 36 | 00 | 09 |
| 15 | | ජපන් සහතික පත්‍ර පාඨමාලාව | | | | | | | 32 | 22 | 11 | 50 |
| 16 | | ජපන් ඩිප්ලෝමා පාඨමාලාව | | | | | | | | | 17 | - |
| | | එකතුව | 1944 | 2035 | 6671 | 3524 | 5315 | 5250 | 6973 | 5977 | 1959 | 1585 |

## 2013 වසරේ සිට 2022 වසර දක්වා උපාධි ලබා ගත් විද්‍යාර්ථීන්

| වර්ෂය | 1. සාහිත්‍ය චක්‍රවර්ති සම්මාන උපාධිය | 2. ආචාර්ය උපාධිය | 3. දර්ශනපති උපාධිය | 4. ශාස්ත්‍රපති උපාධිය | 5. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 6. ශාස්ත්‍රවේදී(සාමාන්‍ය) උපාධිය (අභ්‍යන්තර) | 7. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (බාහිර) | 8. ශාස්ත්‍රවේදී(විශේෂ) උපාධිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2013** | - | - | 01 | 155 | 12 | 79 | 226 | 39 | 512 |
| **2014** | - | 01 | 01 | 107 | 10 | 49 | 07 | 38 | 213 |
| **2015** | - | 02 | - | 122 | 11 | 52 | 444 | 01 | 632 |
| **2016** | 02 | 02 | 02 | 114 | 05 | 17 | 456 | 49 | 647 |
| **2017** | - | 04 | 02 | 81 | 04 | 48 | 123 | 22 | 284 |
| **2018** | 01 | 04 | 07 | 76 | 00 | 59 | 228 | 30 | 405 |
| **2019** | 00 | 04 | 03 | 38 | 02 | 48 | 366 | 54 | 515 |
| **2020** | 03 | 01 | 03 | 38 | 00 | 67 | 179 | 57 | 348 |
| **2021** | 00 | 02 | 02 | 58* | 00 | * | * | * | 62 |
| **2022** | 02 | 10 | 13 | 89 | - | 36 | 72 | 32 | 254 |
| **එකතුව** | 08 | 30 | 34 | 878 | 44 | 455 | 2101 | 322 | |

2013 වසරේ සිට 2022 වසර දක්වා මෙම විශ්වවිද්‍යාලයෙන් බිහිකරන ලද මුළු උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 3872කි.

## උපාධිය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව

උපාධි සමත් ශිෂ්‍ය සංඛ්‍යාව (අභ්‍යන්තර හා බාහිර පාඨමාලා)

අභ්‍යන්තර (2018 සිට 2022 දක්වා)

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (අභ්‍යන්තර) | 59 | 48 | 67 | *36 | 17 | 227 |
| 2. විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය | 30 | 54 | 57 | *32 | 52 | 225 |
| **එකතුව** | **89** | **102** | **124** | ***68** | **69** | **452** |

- ⭑ 2020 අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසික පරීක්ෂණය 2021 මාර්තු/අප්‍රේල් කාල සීමාවේදී පවත්වන ලදී.
- ⭑ 2021 අධ්‍යයන වර්ෂයේ සිව්වන වසර දෙවන සමාසික පරීක්ෂණයේ ප්‍රතිඵල 2022 අප්‍රේල් නිකුත් කර ඇත.
- ⭑ තෙවන වසර පළමු සමාසික පරීක්ෂණය 2021 ඔක්තෝම්බර් නොවැම්බර් මාසයන්හි පැවැත්වුවද මාර්ගගත ක්‍රමවේදය වර්ජනය කිරීම හේතුවෙන් බොහෝ සිසුන් විභාගයට පෙනී නොසිටි බැවින් 2022 වර්ෂයට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) විභාගයෙන් උපාධියට සුදුසුකම් ලැබූ සිසුන් ප්‍රමාණය අඩු වීමට හේතු විය.

## විභාග හා අධ්‍යයන කටයුතු

### 2022 වර්ෂය තුළ පවත්වන ලද අභ්‍යන්තර විභාග පරීක්ෂණ විස්තර

### 2022 ජනවාරි / පෙබරවාරි (මාර්ගගත)

පළමු, දෙවන, තෙවන වසරවල සිසුන් සඳහා අදාළ දෙවන සමාසික පරීක්ෂණ 2022 ජනවාරි / පෙබරවාරි කාලසීමාව තුළදී මාර්ගගතව සිදු කරන ලදී.

- **2022 අගෝස්තු / සැප්තැම්බර්**

පළමු, දෙවන, තෙවන හා සිව්වන වසරවල සිසුන් සඳහා අදාළ පළමු සමාසික පරීක්ෂණ 2022 අගෝස්තු / සැප්තැම්බර් කාලසීමාව තුළදී භෞතිකව සිදු කරන ලදී.

## ප්‍රතිඵල නිකුත් කිරීම

- **2022 ජනවාරි / පෙබරවාරි (මාර්ගගත) - දෙවන සමාසික පරීක්ෂණය**

| වසර | උපාධිය | පළමු වරට පෙනී සිටින | නැවත පෙනී සිටින | එකතුව |
|---|---|---|---|---|
| පළමු වසර | - | 178 | 115 | 293 |
| දෙවන වසර | සාමාන්‍ය | 123 | 51 | 174 |
| | විශේෂ | 30 | 18 | 48 |
| තෙවන වසර | සාමාන්‍ය | 82 | 15 | 97 |
| | විශේෂ | 52 | 14 | 66 |

- **2022 අගෝසතු / සැප්තැම්බර් - පළමු සමාසික පරීක්ෂණය**

2022 අගෝස්තු / සැප්තැම්බර් විභාගයේ පිළිතුරු පත්‍ර පරීක්ෂා කරමින් පවතී.

**උපාධි ලබා ගත් විදේශීය සිසුන් පිළිබඳ තොරතුරු**

- 2021 අධ්‍යයන වර්ෂයේ සිව්වන වසර දෙවන සමාසික පරීක්ෂණය 2021 දෙසැම්බර් 30 මාර්ගගතව පවත්වා අවසන් කළ අතර එහි ප්‍රතිඵල නිකුත් කර නැත.

**උපාධි ලබා ගත් විදේශීය සිසුන් පිළිබඳ තොරතුරු**

- 2021 අධ්‍යයන වර්ෂයේ සිව්වන වසර දෙවන සමාසික පරීක්ෂණය 2021 දෙසැම්බර් 30 මාර්ගගතව පවත්වා අවසන් කළ අතර එහි ප්‍රතිඵල නිකුත් කර නැත.

**ශිෂ්‍යත්ව නිර්ණායකයන්ට අනුව 2022 වර්ෂයට ශිෂ්‍යත්ව සඳහා**
**හිමිකම් ලබන සිසුන් සංඛ්‍යාව**

| | ශිෂ්‍යත්වයේ නම | සිසුන් ගණන | ශිෂ්‍යත්ව මුදල |
|---|---|---|---|
| 1. | මහෝපාධ්‍යායය ස්වර්ණ මුද්‍රිකාව | 02 | වර්ෂයක් සඳහා ලැබී ඇති පොලී මුදල් සහ ඉතිරි මුදල් ප්‍රමාණය අනුව ශිෂ්‍යත්ව කමිටුව විසින් ශිෂ්‍යත්ව මුදල තීරණය කරනු ලබයි. |
| 2. | එච්. එම්. තිසේරා අනුස්මරණ ත්‍යාගය | 00 | |
| 3. | පී. සුභසිංහ ත්‍යාගය | 01 | |
| 4. | පිඹුරේ ශ්‍රී වාගීශ්වර නායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය | 01 | |
| 5. | කලුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර මහානායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය | 02 | |
| 6. | මියුලින් ලියනගේ අනුස්මරණ ත්‍යාගය | 01 | |
| 7. | අතිපූජ්‍ය සිරිමල්වත්තේ ආනන්ද මහානායක අනුස්මරණ ත්‍යාගය | 02 | |
| 8. | කොරියන් ජාතික හේ ජෝන් ස්වාමීන්ද්‍ර ශිෂ්‍යත්වය | 03 | |
| 9. | ෆ්‍රැන්සිස් හේවාවිදාන ත්‍යාගය | 04 | |
| 10. | බදුරලියේ ජිනාරාම නාහිමි අනුස්මරණ ශිෂ්‍යත්වය | 01 | |
| 11. | හීනටියන ධම්මාලෝක නාහිමි අනුස්මරණ ශිෂ්‍යත්වය | 01 | |

| | | | |
|---|---|---|---|
| 12. | කුඹුකේ දොන් සානිස් අප්පුහාමි සහ වන්නිආරච්චිලාගේ ජොස්තිනා ෆොන්සේකා අනුස්මරණ ත්‍යාගය | 01 | |
| 13. | මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමි ත්‍යාගය | 01 | පෞද්ගලික ශිෂ්‍යත්ව වේ. |
| 14. | ශ්‍රීමත් සිරිල් ද සොයිසා අනුස්මරණ ශිෂ්‍යත්වය - (පාලි) | 01 | |
| 15. | ශ්‍රීමත් සිරිල් ද සොයිසා අනුස්මරණ ශිෂ්‍යත්වය - (බෞද්ධ දර්ශනය) | 01 | |
| 16. | ගාමණී ජයසූරිය පාලි ශිෂ්‍යත්වය | 03 | |
| 17. | එන්. සොමිලාවති බෙල්ගොඩපිටිය ශිෂ්‍යත්වය | 02 | |
| 18. | අලුදෙණියේ පඤ්ඤානන්ද මාහිමි අනුස්මරණ පාලි ව්‍යාකරණ ත්‍යාගය | 02 | වර්ෂයක් සඳහා ලැබී ඇති පොලී මුදල් සහ ඉතිරි මුදල් ප්‍රමාණය අනුව ශිෂ්‍යත්ව කමිටුව විසින් ශිෂ්‍යත්ව මුදල තීරණය කරනු ලබයි. |
| 19. | මහාචාර්ය මොරටුවේ සාසනරතන අනුනාහිමි අනුස්මරණ ත්‍යාගය | 01 | |
| 20. | අතිපූජ්‍ය වැරැල්ලාගේ විමලතිස්ස නාහිමි අනුස්මරණ ත්‍යාගය | 01 | |
| 21. | විතාරන්දෙණියේ චන්දජෝති නා හිමි අනුස්මරණ ත්‍යාගය | 03 | |
| 22. | මහාචාර්ය ඔලිවර් අබේනායක ත්‍යාගය | 01 | |
| 23. | Ven. Thich Thien Son අභිනන්දන පාලි ත්‍යාගය | 02 | |
| 24. | එච්.එම්. ගුණතිලක බණ්ඩාර හේරත්, පී.එම්.ජී.ආර්. පුංචිමැණිකේ ශිෂ්‍යත්ව අරමුදල | 01 | |
| 25. | පූජ්‍ය බානගල උපතිස්ස නාහිමි ත්‍යාගය | 01 | |
| 26. | ශ්‍රීමත් අනගාරික ධර්මපාල අනුස්මරණ ශිෂ්‍යත්ව ත්‍යාගය | 01 | |
| 27. | හෙම්මාතගම ශ්‍රී සිද්ධාර්ථ නාහිමි ත්‍යාගය | 01 | |
| 28. | අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක අනුස්මරණ ත්‍යාග අරමුදල | 01 | |
| 29. | අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල මාහිමි අභිනන්දන ත්‍යාග අරමුදල | 01 | |

| | | | |
|---|---|---|---|
| 30. | වැගම පියරතන නාහිමි අභිනන්දන පාලි ත්‍යාග අරමුදල | 01 | |
| 31. | ටී.එම්.ජේ.බී. තෙන්නකෝන් අනුස්මරණ ත්‍යාගය | 01 | |
| 32. | පූජ්‍ය කුරුණෑගොඩ පියතිස්ස නාහිමි ත්‍යාගය | 01 | |
| | **එකතුව** | **45** | |

**අධ්‍යයන කාර්ය මණ්ඩලය**

**අධ්‍යයන කාර්ය මණ්ඩලය 31.12.2022 දිනට (ඉගැන්වීම් කටයුතුවල නිරත වන)**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| මහෝපාධ්‍යායයන් වහන්සේ | 01 | 01 | 01 |
| මහාචාර්ය (විශේෂඥ) | 05 | 01 | 04 |
| මහාචාර්ය/සහාය මහාචාර්ය | 61 | 46 | 15 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | | | |
| කථිකාචාර්ය | | | |
| කථිකාචාර්ය/ආධුනික | | | |
| බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශිකා | 01 | 01 | 00 |
| පරිගණක උපදේශක | 01 | 00 | 01 |
| **එකතුව** | **69** | **49** | **21** |

**අධ්‍යයන කාර්ය මණ්ඩලය 31.12.2022 දිනට (ඉගැන්වීම් කටයුතුවල නිරත නොවන)**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පුස්තකාලයාධිකාරී | 01 | 00 | 01 |
| සහකාර පුස්තකාලයාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | 01 | 01 | 00 |
| **එකතුව** | **02** | **01** | **01** |

## අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - 2022..12.31

| අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | පුස්තකාලයාධිකාරී | කථිකාචාර්ය | ආධුනික කථිකාචාර්ය | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | පරිගණක උපදේශක | බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාෂා අධ්‍යයන පීඨය | 02 | 03 | 02 | 02 | 10 | - | 04 | 04 | 00* | 00* | 00* | **27** |
| බෞද්ධ අධ්‍යයන පීඨය | 01 | 06 | - | - | 10 | - | 04 | 05 | - | 00 | 01 | **27** |
| පුස්තකාලය | - | - | - | - | - | 00* | - | - | 01 | 00* | 00* | **01** |
| **එකතුව** | **03** | **09** | **02** | **02** | **20** | **00*** | **08** | **09** | **01** | **00*** | **01** | 55 |

* පුරප්පාඩු පවතී.

## බාහිර කථිකාචාර්යවරුන් පිළිබඳ විස්තර

| **බෞද්ධ අධ්‍යයන පීඨය** | **බාහිර කථිකාචාර්ය** |
|---|---|
| බෞද්ධ දර්ශනය | 03 |
| බෞද්ධ සංස්කෘතිය | 02 |
| පුරාවිද්‍යාව | 01 |
| සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය අධ්‍යනාංශය | 04 |
| බෞද්ධ උපදේශනය | 03 |
| **එකතුව** | 13 |

| **භාෂා අධ්‍යයන පීඨය** | **බාහිර කථිකාචාර්ය** |
|---|---|
| සංස්කෘත | 03 |
| පාලි | 03 |
| සිංහල | 03 |
| භාෂා නිපුණතා සංවර්ධන | 09 |
| ඉංග්‍රීසි ඉගැන්වීම් අධ්‍යයනාංශය | 01 |
| **එකතුව** | 19 |

## බාහිර කථිකාචාර්යවරුන් පත් කිරීම - පීඨ අනුව

| පීඨය | බාහිර කථිකාචාර්ය |
|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය | 11 |
| භාෂා අධ්‍යයන පීඨය | 15 |
| එකතුව | 26 |

## පර්යේෂණ සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| | ඉදිරිපත් කළ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2020 | 2021 | 2022 |
| පර්යේෂණ | 55 | 58 | 29 |
| සඟරා | 34 | 33 | 30 |
| ලිපි | 123 | 140 | 47 |
| **මුළු සංඛ්‍යාව** | **212** | **231** | **106** |

## පර්යේෂණ සහ ප්‍රකාශන - 2022 (පීඨ අනුව)

| | පර්යේෂණ ගණන | සඟරා | ලිපි | **මුළු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය | 13 | 14 | 31 | 58 |
| භාෂා අධ්‍යයන පීඨය | 16 | 16 | 16 | 48 |
| **මුළු සංඛ්‍යාව** | **29** | **30** | **47** | **106** |

## පුස්තකාලය පිළිබඳ තොරතුරු

### කාර්ය මණ්ඩල සංයුතිය

පුස්තකාලයාධිකාරී - පුරප්පාඩුව ඇත
වැඩ බලන පුස්තකාලයාධිකාරී (සප්තවාර්ෂික නිවාඩු) - 01
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01
ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පුස්තකාල තොරතුරු සේවා) - 01
පුස්තකාල තොරතුරු සහකාර - 05
පුස්තකාල සහායක - 06
යන්ත්‍ර ක්‍රියාකරු - 01

### පුස්තකාල ලියාපදිංචි පාඨක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| උපාධි අපේක්ෂකයන් | - | 656 |
| ආචාර්ය මණ්ඩලය | - | 50 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - | 116 |

### පුස්තකාල පරිශීලනය (හෝමාගම ප්‍රධාන පුස්තකාලය)

| | | |
|---|---|---|
| සිසුන් | - | 6445 |
| ආචාර්ය මණ්ඩලය | - | 144 |
| පර්යේෂකයන් | - | 220 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - | 45 |

### කොළඹ පරිශ්‍රයීය පුස්තකාලය

**ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| පශ්චාද් උපාධි අපේක්ෂකයන් | - | 136 |
| ඩිප්ලෝමා පාඨමාලා | - | 80 |

### වර්ෂය තුළදී අත්කර ගත් ප්‍රතිග්‍රහණ (පොත්/සඟරා)

| | |
|---|---|
| මිලදී ගත් පොත් සංඛ්‍යාව | - 576 |
| පරිත්‍යාග ලෙස ලැබුණු පොත්/ප්‍රකාශන | - 214 |
| පොත් මිලදී ගැනීමට වැයවූ මුදල | - රු. 405,111.50 |
| පරිත්‍යාගවල වටිනාකම | - රු. 125,338.00 |

### 2022.12.31 දිනට පුස්තකාලයේ ඇති ග්‍රන්ථ ප්‍රමාණය

| | |
|---|---|
| ප්‍රතිග්‍රහණ ලේඛනයට අනුව පවතින ග්‍රන්ථ ප්‍රමාණය | - 59743 |

**01. අන්තර් පුස්තකාල පිරුළු සේවාව**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ පොත් විද්‍යුත් සඟරා ලිපි ලබාගැනීම.

**02. පොත් බැඳුම්කරණය**

ග්‍රන්ථ 283ක් බැඳුම්කරණය කර ඇත.

**03. සූචිකරණය**

ග්‍රන්ථ 636ක් සූචිකරණය කිරීම.

**04. වර්ගීකරණය**

ග්‍රන්ථ 646 ක් වර්ගීකරණය කර ඇත.

**05 සංයුක්ත සැලැස්ම ප්‍රකාර නව ප්‍රතිග්‍රහණ ලැයිස්තු පවත්වාගෙන යාම**

පුස්තකාලයට අත්පත් කරගත් නවතම ග්‍රන්ථ පිළිබඳ විද්‍යුත් තැපැල මගින් ආචාර්ය මණ්ඩලය දැනුවත් කිරිම.

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී**

**සහභාගී වු සම්මන්ත්‍රණ**

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය 2022.12.14 වන දින පවත්වන ලද 160 වන අධ්‍යයන කාර්ය මණ්ඩල පර්යේෂණ සැසියෙහිදී පහත සඳහන් මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

**A study on the awareness and use of sustainable library development initiatives among academic librarians (selected University Libraries, Sri Lanka)**

**සම්පත් දායකත්වය**

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය බෞද්ධ අධ්‍යයන පර්යේෂණ පර්ෂදය මගින් සංවිධනාය කරන ලද දේශන අංක 15ට අදාළ පර්යේෂණ සඳහා **තොරතුරු මූලාශ්‍ර භාවිතය** මැයෙන් 2022.02.10 දින **Zoom** තාක්ෂණය යටතේ දේශනයක් පැවැත්වීම.

**පීඨ**

**බෞද්ධ අධ්‍යයන පීඨය**

**ආචාර්ය මණ්ඩලයඃ**

☆ **බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය (08)**

1. මහාචාර්ය පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන් වහන්සේ (අංශාධිපති)
2. මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ
3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉළුක්කේවෙල ධම්මරතන හිමි
4. කථිකාචාර්ය පූජ්‍ය යෝධකණ්ඩියේ අරියවංස ස්වාමීන් වහන්සේ
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය මොරගස්වැවේ විජිත ස්වාමීන් වහන්සේ
6. කථිකාචාර්ය පූජ්‍ය කෝන්කඳවල විමලධම්ම ස්වාමීන් වහන්සේ
7. බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශිකා ඩබ්.පී.එල්.එම්. නිලුෂිකා මහත්මිය
8. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දාපනේ චන්දරතන හිමි

☆ **බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය (08)**

1. මහාචාර්ය නිලන්ත පී. දිසානායක මහතා (අංශාධිපති)
2. මහාචාර්ය එම්. ඒ. සී. මුණසිංහ මහත්මිය
3. මහාචාර්ය පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි
4. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝමානන්ද හිමි
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි
6. කථිකාචාර්ය පූජ්‍ය රිදීගම වනරතන හිමි
7. කථිකාචාර්ය පූජ්‍ය සෙල්ලකතරගම ඥානාලංකාර හිමි
8. කථිකාචාර්ය (ආධුනික) රක්ෂණ සුපුන් කළුආරච්චි මහතා

☆ **පුරාවිද්‍යා අධ්‍යයනාංශය (04)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය බැරගම සද්ධානන්ද ස්වාමීන් වහන්සේ (අංශාධිපති)
2. මහාචාර්ය එච්.එම්.වයි.කේ. හේරත් මහත්මිය
3. මහාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මහත්මිය
4. කථිකාචාර්ය ආචාර්ය වැලිවිටගේ ඉෂංඛ මල්සිරි මහතා

## ✯ සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය අධ්‍යයනාංශය (04)

1. විශ්‍රාමික මහාචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ (අංශාධිපති)
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දම්පහල රාහුල ස්වාමීන් වහන්සේ
3. කථිකාචාර්ය (ආධුනික) ජී.එස්. චරිත් ප්‍රියදර්ශන මහතා
4. කථිකාචාර්ය ජීවන්ති යසන්තිකා මහත්මිය (ඒකක ප්‍රධාන - පරිගණක ඉගැන්වීම් ඒකකය)

**භාෂා අධ්‍යයන පීඨය**

භාෂා අධ්‍යයන පීඨය පහත දැක්වෙන අයුරින් අධ්‍යයනාංශ හයකින් (06) යුක්ත වෙයි.

සිංහල අධ්‍යයනාංශය
පාලි අධ්‍යයනාංශය
සංස්කෘත අධ්‍යයනාංශය
ඉංග්‍රීසි අධ්‍යයනාංශය
භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශය
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යනාංශය

මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යයෙහි නිරත වී සිටින ඡාත්‍ර ගණයා දැනුමින් හා ශික්ෂණයෙන් යුතු පිරිසක් බවට පත් කිරීමත් ධර්මධර විනයධර ශික්ෂාකාමී විද්‍යාර්ථීන් පිරිසක් බිහි කිරීමත් භාෂා අධ්‍යයන පීඨයේ ප්‍රධාන අරමුණකි. එසේ ම දේශීය හා විදේශීය වශයෙන් බුද්ධධර්මය ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය භාෂා ඥානය ලබා දීම මේ පීඨයේ තවත් මුඛ්‍ය අරමුණක් වෙයි.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය**

**පීඨාධිපති** - මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස හිමි (වැඩ ආවරණ)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා

**අධ්‍යයනාංශ ප්‍රධානීන්**

1. **පාලි අධ්‍යනංශාධිපති** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය කොටියාගල උපරතන හිමි
2. **සිංහල අධ්‍යනංශාධිපති** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඒ.එල්.එන්.පී. පෙරේරා මිය
3. **සංස්කෘත අධ්‍යනංශාධිපති** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
   මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස හිමි
4. **ඉංග්‍රීසි අධ්‍යනංශාධිපති** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිපුණිකා සඳමාලි මිය
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය වරුණි තෙන්නකෝන් මහත්මිය
5. **ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ස්වර්ණානන්ද ගමගේ මහතා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රදීප් ගුණසේන මහතා
6. **භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශය** -ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිරෝෂා සල්වතුර මිය
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඊ.පී.අයි.වික්‍රමසිංහ මිය

**ආචාර්ය මණ්ඩලය**

☆ **පාලි අධ්‍යයනාංශය (05)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය කොටියාගල උපරතන හිමි (අංශාධිපති)
2. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි (සප්ත වාර්ෂික)
3. මහාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි (පීඨාධිපති - පශ්චාද් උපාධි)
4. මහාචාර්ය පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි (2017.08.09 දින සිට අධ්‍යයන නිවාඩු)
5. කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය කන්දේගම දීපවංසාලංකාර හිමි

☆ **සිංහල අධ්‍යයනාංශය (04)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඒ.එල්.එන්.පී. පෙරේරා මිය (අංශාධිපති - සිංහල අධ්‍යයනාංශය)
2. සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි
3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය යූ.පී. ගමගේ මහතා
4. කථිකාචාර්ය (ස්ථිර නොකළ) ආචාර්ය පූජ්‍ය පදියතලාවේ අමරවංශ හිමි

☆ **සංස්කෘත අධ්‍යයනාංශය (04)**

1. මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස හිමි (අංශාධිපති)
2. මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි
3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
4. කථිකාචාර්ය (ස්ථිර නොකළ) ආචාර්ය පූජ්‍ය ඇත්කඳුරේ සුමනසාර හිමි

☆ **ඉංග්‍රීසි අධ්‍යයනාංශය (03)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය වරුණි තෙන්නකෝන් මිය (අංශාධිපති)
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. නිපුනිකා සඳමාලි දිලානි මිය
3. කථිකාචාර්ය (ආධුනික) තිළිණි නිලංකා වීරසූරිය මෙය

☆ **භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශය (06)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිරෝෂා සල්වතුර මිය (අංශාධිපති)
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එන්. මල්ලිකාදේවි මිය
   (2020.02.05 දින සිට අධ්‍යයන නිවාඩු ලබා ඇත)
3. කථිකාචාර්ය (ආධුනික) කේ.ජී.කෞශකී ද සිල්වා මිය
   (2019.10.01 දින සිට අධ්‍යයන නිවාඩු ලබා ඇත)
4. කථිකාචාර්ය (ආධුනික) එස්.නිමාලි ප්‍රියංගිකා මිය
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඉන්දීවරී වික්‍රමසිංහ මිය
6. කථිකාචාර්ය (ආධුනික) ඩබ්ලිබ්.ජී.රංගනී ආරියවංශ මිය

☆ **ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය (03)**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රදීප් ගුණසේන මහතා
   (අංශාධිපති)
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කේ.ජී. ස්වර්ණානන්ද මහතා

3. කථිකාචාර්ය කේ. ජී. කුමාරගේ මිය (2020.04.23 දින සිට අධ්‍යයන නිවාඩු ලබා ඇත)

**මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය :-භාෂා අධ්‍යයන පීඨය**

| **අධ්‍යයනාංශය** | **විෂයය** | **මාධ්‍යය** | **නම** | **තනතුර** |
|---|---|---|---|---|
| | | | පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි | සහාය මහාචාර්ය |
| | | | ආචාර්ය ඒ.එල්.එන්.පී. පෙරේරා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | | | යූ.පී. ගමගේ මහතා | කථිකාචාර්ය |
| **පාලි අධ්‍යයනාංශය** | පාලි | සිංහල/ ඉංගීසි | පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| | | | පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි | මහාචාර්ය |
| | | | පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි | මහාචාර්ය |
| | | | ආචාර්ය පූජ්‍ය කොටියාගල උපරතන හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | | | කන්දේගම දීපවංසාලංකාර හිමි | කථිකාචාර්ය |
| **සංස්කෘත අධ්‍යයනාංශය** | සංස්කෘත | සිංහල/ ඉංගීසි | පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි | මහාචාර්ය |
| | | | ආචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | | | ආචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස හිමි | මහාචාර්ය |

| | | | | |
|---|---|---|---|---|
මූල්‍ය වාර්තා සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ භාවිතා වන රුපියල් ශත වලින් වටිනාකම් ගණනය කොට ඇති අතර, ගිණුම් වාර්තා අවසාන රුපියලට වටයීමට කටයුතු කර ඇත.

(d) **අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරිත්වය විසින් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමකදී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කිරීමට හැකියාව ඇති අතර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කර ඇත.

(e) **සංසන්දනාත්මක තොරතුරු**

මූල්‍ය ප්‍රකාශන පරිශීලනයේ දී වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා හා සැසඳීමේ හැකියාව වර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ පසුගිය ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ තොරතුරු අනාවරණය කර ඇත.

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය සාරාංශයක් ලෙස ඉදිරිපත් කර ඇති අතර, විස්තරාත්මක තොරතුරු සටහන් මඟින් ඉදිරිපත් කර ඇත.

(f) **ප්‍රමාණාත්මතාව හා සමාහරණය**

අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ නම් හෝ අසමාන ස්වභාවයේ ඇත්නම් හැර සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම සටහන් ලෙස ඉදිරිපත් කර ඇත.

(g) **ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාව, වත්කම් හා බැරකම් ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

**1.1.5 ආදායම් හඳුනාගැනීම**

වාර්තාකරන ලද කාලපරිච්ඡේදය තුළ ආර්ථික ප්‍රතිලාභය විශ්වවිද්‍යාලයට ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වසනීය ලෙස මැනිය හැකි වන විට ආදායම හඳුනාගනු ලැබේ.

**1.1.6 දේපල පිරියත හා උපකරණ සහ ඒවා අගය කිරීම**

**1.1.6.1 වත්කම් හඳුනා ගැනීම**

වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමේ සම්භාවිතාවක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විට, වත්කම හඳුනාගැනීම සිදු වේ.

(a) දේපල, පිරියත හා උපකරණ යන වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්ෂය අඩු කළ පසු අගයට වාර්තා කර ඇත.

(b) මෙම වත්කම් මිලදී ගත් පිරිවැය හෝ ඉදි කරන ලද පිරිවැය මත සහ ඒ සඳහා දරන ලද මූලික වියදම් ඇතුළත්ව සටහන් කොට ඇත.

(c) විශ්වවිද්‍යාලය වෙත හෝමාගම පුහුනු කෘෂිකර්ම මධ්‍යස්ථානය ලබා දුන් පර්චස් 4ක ඉඩම රු. 243,750.00කට ඇස්තමේන්තු කර ගිණුම්ගත කර තිබූ අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2022.06.03 දිනැතිව ලැබූ තක්සේරුව රු. 200,000.00කි. එය ප්‍රවර්තන වර්ෂයේ සංශෝධනය කර ගිණුම්ගත කර ඇත.

(d) 2022.01.27 දින නේවාසිකාගාර උප පාලක නිල නිවාස II භාවිතා කිරීම ආරම්භ කර ඇති බැවින් කෙරීගෙන යන වැඩවලින් ඉවත්කර වත්කම් ගිණුමට මාරු කර ඇත.

**1.1.6.2 වත්කම් ක්ෂය කිරීම**

(a)1. ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ක්ෂය කර ඇති අතර, ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇත. ක්ෂය කර ඇති වත්කම්වල ක්ෂය අනුපාතය හා ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | ගොඩනැගිලි | 05% | (වර්ෂ 20) |
| 2. | ලී බඩු සහ සවිකිරීම් | 10% | (වර්ෂ 10) |
| 3. | කාර්යාල උපකරණ | 20% | (වර්ෂ 05) |
| 4. | පුස්තකාල පොත්පත්, සඟරා | 20% | (වර්ෂ 05) |
| 5. | මෝටර් වාහන | 20% | (වර්ෂ 05) |
| 6. | උපාධි ලෝගු | 20% | (වර්ෂ 05) |

11. හඳුනාගත් වත්කම්වලට අදාළ ක්ෂය වීම් ගැලපීමේදී වත්කම් මිලදී ගැනීම/ඉදි කිරීම සහ බැහැර කිරීමට අදාළ කාලසීමාව සලකා කාලානුරූපීව ගැලපීම් සිදු කර ඇත.

111. පුස්තකාල පොත් හා වාර සඟරා පරිත්‍යාගයන් වසර පුරා පරිත්‍යාග ලෙස ලැබෙන අතර පොත් පත් පරිශීලනය සඳහා යොමු කරන කාල සීමාව අනුව ක්ෂය කිරීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් එම වසර තුළ ක්ෂය කිරීම සිදු නොවේ.

**1.1.6.3 වත්කම් ප්‍රත්‍යාගණනය**

ප්‍රත්‍යාගණනය කරනු ලබන වත්කම් ජංගම නොවන වත්කම් ලෙස සටහන් කර ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට අපේක්ෂිත අතර, එම කටයුතු සිදු කිරීමෙන් පසු ගිණුම්වලට ගැලපීම සිදු කරනු ඇත.

1.1.6.4 **භාණ්ඩාගාරයෙන් සහ අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද වාහන**

භාණ්ඩාගාරයෙන් හා අමාත්‍යාංශයෙන් 2015 දක්වා පවරන ලද වාහනවලට අදාළව රජයේ මූලධන ප්‍රතිපාදන ගිණුමේ ශේෂය ලියා හැරීමට කටයුතු කරන ලද අතර 2020.12.31 දිනට මුළු ශේෂය ලියා හැරීම අවසන් වී ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පරිත්‍යාග කරන ලද මෝටර් රථ 02ක් KO 4474, KC-5084 2019 දෙසැම්බර් මස 23 වෙනි දින ලැබී ඇති අතර ඒවායේ අයිතිය 2022 දෙසැම්බර් 13 දින විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන ඇත.

වාහන ප්‍රත්‍යාගණනය කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, තක්සේරු කළ වහාම අදාළ පිරිවැය ගිණුම්ගත කරනු ලැබේ.

1.1.7 **කෙරීගෙන යන වැඩ**

වත්කම ඉදිකිරීම අවසන් වූ පසු හා භාවිතයට ගත හැකි තත්ත්වයට පත් වූ පසු දේපළ පිරියත හා උපකරණවල අදාළ වත්කම් වර්ගයට මාරු කරනු ලැබේ.

ඒ ඒ වර්ෂවල දී ආරම්භ කර ඇති පහත සඳහන් කෙරීගෙන යන ව්‍යාපෘතිවල 2022 වර්ෂ අවසානයේ සමුච්චිත පිරිවැය පහතින් දක්වා ඇත.

| ඉදිකිරීම් ආරම්භ කළ වර්ෂය | ව්‍යාපෘතිය | මුදල රු. |
|---|---|---|
| 2017 | විදේශීය ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදි කිරීම | 154,008,307 |
| 2017 | පස් මහල් ගොඩනැගිල්ලක් කොළඹ පරිශ්‍රයේ ඉදි කිරීම | 548,902 |

1.1.8 **අස්පෘශ්‍ය වත්කම්**

අස්පෘශ්‍ය වත්කම් ලෙස නිපුණතා සංවර්ධනය හා මෘදුකාංග සංවර්ධනය සටහන් අංක 16 මගින් දක්වා ඇත. මෘදුකාංග සඳහා ක්ෂය අනුපාතිකය 20%ක් ලෙස සහ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 05ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**නිපුණතා සංවර්ධනය**

(a) ශිෂ්‍යයන් සඳහා දරනු ලබන නිපුණතා සංවර්ධන ප්‍රාග්ධන වියදම් වර්ෂ 3ක් තුළ පොත්වලින් ලියා හැරීම සිදු කරනු ලබයි.

(b) අනධ්‍යයන සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන නිපුණතා සංවර්ධන ප්‍රාග්ධන වියදම් වසර 4 කින් පොත්වලින් ලියා හැරීම සිදු කරනු ලබයි.

1.1.9 **තොග අගය කිරීම**

(a) විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පත් කරන ලද කමිටුවක් මගින් වර්ෂ අවසාන තොගය සමීක්ෂණය හා ගණනය කිරීම සිදු කර 2022.12.31 දිනට තොග අගය කරනු ලැබේ. කාර්යාලීය පාරිභෝජන ද්‍රව්‍ය තොගය පිරිවැය මත අගය

කොට ඇති අතර, තොග නිකුත් කිරීමේ පදනම ලෙස ප්‍රථමයෙන් ලැබුණු ප්‍රථමයෙන් නිකුත් කිරීමේ පදනම (FIFO) උපයෝගි කර ගනු ලබයි.

(b) විකිණීම සඳහා ඇති ප්‍රකාශන තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගය මත ගිණුම් තබා ඇත.

### 1.1.10 ආයෝජන

පාලක සභා අනුමැතිය මත, විශ්වවිද්‍යාලයට ලැබී ඇති ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල්, ස්ථාවර තැන්පතු සහ ඉතිරිකිරීමේ ගිණුමක පවත්වාගෙන යනු ලබයි. තැන්පතුවට අදාළව උපචිත වන පොලිය පදනම් කරගෙන වාර්ෂිකව ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබයි.

2022 වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලද මුදලින් පූජ්‍ය ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව අරමුදල, මහාචාර්ය පූජ්‍ය තෙලුවේ සුමනවංස අභිනන්දන අරමුදල හා Shinnyo.en Shinso Ito ශිෂ්‍යත්ව භාර අරමුදල නමින් නව අරමුදල් තුනක් ආරම්භ කර ඇත.

2022 වර්ෂය තුළ පහත සඳහන් පරිදි නව ස්ථාවර තැන්පතු ආරම්භ කර ඇත.

| අරමුදල | මුදල රු. |
|---|---|
| මහෝපාධ්‍යාය අරමුදල | 913,525 |
| වෛද්‍යාධාර අරමුදල | 1,023,804 |
| ශිෂ්‍ය සුභසාධන අරමුදල | 60,327 |
| ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල | 2,000,000 |
| පූජ්‍ය ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව අරමුදල | 1,000,000 |
| මහාචාර්ය පූජ්‍ය තෙලුවේ සුමනවංස අභිනන්දන අරමුදල | 580,000 |
| Shinnyo.en Shinso Ito ශිෂ්‍යත්ව භාර අරමුදල | 10,000,000 |

ස්ථාවර තැන්පත් ගිණුම්වල තැන්පත් කරනු ලැබූ එක් එක් අරමුදල් සඳහා ලැබෙන පොලිය එම අදාළ අරමුදලට බැර කරනු ලබන අතර, මහෝපාධ්‍යාය අරමුදලේ පොලිය පමණක් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පුනරාවර්තන ගිණුමට බැර කරනු ලබයි.

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ අතිරික්ත අරමුදල් පහත පරිදි 2022 වර්ෂයේ දී තැන්පත් කිරීම සිදු කර ඇත.

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 73,262,500 |
| වර්ෂය තුළ තැන්පත් කිරීම් | 31,837,500 |
| වර්ෂ අවසාන ශේෂය | 105,100,000 |

අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලිය පුනරාවර්තන වියදම් පියවා ගැනීමට එම ගිණුමට බැර කරනු ලැබේ.

**කෙටිකාලීන ආයෝජන**

කෙටිකාලීන ආයෝජන ලෙස දක්වා ඇත්තේ වර්ෂයකට අඩු කාලසීමාවක් සහිත ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීමේ ගිණුම් වේ.

### 1.1.11 වගකීම් සහ වෙන්කිරීම්

(a) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව, 2022.12.31 දිනට විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම ආයු ගණන තක්සේරු ක්‍රමය මත (Actuarial Valuation) පදනම්ව ගණනය කර ඇත. ඒ අනුව ආයතනය විසින් පාරිතෝෂික වගකීමේ සාධාරණ අගය පුරෝකථන ඒකක ක්‍රමය (Projected Unit Credit Method) අනුගමනය කර ඇති අතර Actuarial & Management Consultants (Pvt) Limited ආයතනය මඟින් ගණනය කිරීම් සිදු කර ඇත.

පාරිතෝෂික දීමනා ගණනය කිරීමේ දී මූලික වැටුප, ජීවන වියදම් දීමනාව, අධ්‍යයන දීමනාව හා එකතු කරන ලද මාසික දීමනාව අදාළ කරගෙන ඇත.

**1.1.12 අසම්භාව්‍ය බැරකම්**

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවකයින් හා බාහිර පාර්ශවයින් විසින් විශ්වවිද්‍යාලයට විරුද්ධව පනවා ඇති නඩු සම්බන්ධව අදාළ විස්තර පහත පරිදි දක්වා ඇත. මෙම නඩු සම්බන්ධව අවසාන තියෝගයක් මෙතෙක් ලැබී නොමැති බැවින් මූල්‍යමය බැඳීමේ වටිනාකම පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹිය නොහැකිය.

| | නඩු අංකය | නඩුව පිළිබඳ විස්තරය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01 | CA/Writ/46/2019 | උසස්වීම සම්බන්ධයෙනි | 2023.02.27 දින කැඳවනු ලැබේ. |
| 02 | SC(FR)86/2009 | නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධයෙනි | 2023.03.14 දින කැඳවනු ලැබේ. |
| 03 | A/27/2021 | සේවා ස්ථිරත්වය ලබා නොදීම සම්බන්ධයෙනි | 2023.03.13 දින කැඳවනු ලැබේ. |
| 04 | SC/FR/214/2021 | සම්මුඛ පරීක්ෂණයක තීරණයක් සම්බන්ධයෙනි | 2023.05.17 දින කැඳවනු ලැබේ. |
| 05 | CA(Writ) 399/2020 | පත්වීමක් සම්බන්ධයෙනි | 2023.03.03 දින කැඳවනු ලැබේ. |

**1.1.13 වැය නොවූ මූලධන ආධාර**

වැය නොවූ මූලධන ආධාර සටහන් අංක: 28 මඟින් සැසඳීම සිදු කර ඇත.

**1.2.1 බදු ගෙවීම**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

**1.2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශ වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇත.

**1.2.3 මුදල් හා මුදල්වලට සමාන වත්කම්**

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවෙන් යුත් කෙටිකාලීන තැන්පතු, මුදල් හා මුදල්වලට සමාන දෑ යන්නට ඇතුළත් වේ.

**විදේශ විනිමය ගණුදෙනු හා ශේෂයන්**

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශවල ආදායම් හා වියදම් ගණුදෙනු රජයේ විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කර ඇත. පෙර වර්ෂයේ අවසන් අනුපාතිකයට වඩා ප්‍රවර්තන වර්ෂයේ අවසන් අනුපාතිකය වෙනස් වන අවස්ථාවල එම ඌනතාවය හෝ අතිරික්තය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබේ.

**1.2.3 වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරුවලට ප්‍රමාණාත්මකව බලපාන කිසිදු සිදුවීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් පසුව සිදු වී නොමැත.

### 1.2.4 ප්‍රතිපාදන හා වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අරමුදලට ප්‍රවර්තන බැඳීමක් පවතින විට එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභවලින් යුතු සම්පත් පිටතට ගලා යාම හව්‍යවන විටෙක හා බැඳීමේ ප්‍රමාණයෙහි විශ්වාසදායි ඇස්තමේන්තුවක් කළ හැකි විටෙක ප්‍රතිපාදනය හඳුනාගනී.

### 1.2.5 සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදු කළ ගණුදෙනු

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පාලක සභා සාමාජිකයන් සමඟ සිදු කළ ගණුදෙනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතුවල දී සිදු වූ ගණුදෙනු වේ. 2022 වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු පහතින් දක්වා ඇත.

| පාලක සභා සාමාජිකයන්ගේ නම් | පාලක සභා අනෙකුත් කමිටු සාමාජික ගාස්තු | කමිටු සඳහා ප්‍රවාහන දීමනාව | මුළු වටිනාකම |
|---|---|---|---|
| පූජ්‍ය ත්‍රිකුණාමලේ ආනන්ද මහානායක හිමි | 36,000 | 1,500 | 37,500 |
| ආචාර්ය පූජ්‍ය නියන්ගොඩ විජිතසිරි අනුනායක හිමි | 24,000 | 10,000 | 34,000 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි | 12,000 | - | 12,000 |
| පූජ්‍ය නැදගමුවේ විජය මෛත්‍රී හිමි | 36,000 | 24,000 | 60,000 |
| පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි | 30,000 | 12,000 | 42,000 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විමල් විජේරත්න මහතා | 48,000 | - | 48,000 |
| මහාචාර්ය කේ.ඒ. වීරසේන මහතා | 60,000 | 7,500 | 67,500 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා | 96,000 | 41,500 | 137,500 |
| නීතිඥ කල්‍යානන්ද තිරාණගම මහතා | 50,000 | - | 50,000 |
| ජනාධිපති නීතිඥ ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා | 78,000 | 3,000 | 81,000 |
| ටී.කේ.ඩබ්ලිව්.ටී.පී. ප්‍රේමරත්න මහත්මිය | 128,000 | 9,000 | 137,000 |
| සෝමරත්න විදානපතිරණ මහතා | 52,000 | 6,000 | 58,000 |
| **මුළු වටිනාකම** | **650,000** | **114,500** | **764,500** |

සටහන 02

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|---|
| | | බාහිර | අභ්‍යන්තර | එකතුව | බාහිර | අභ්‍යන්තර | එකතුව |
| ආදායම් | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර | 03 | 17,354,150 | 444,540,850 | 461,895,000 | 17,222,364 | 399,777,636 | 417,000,000 |
| විශ්වවිද්‍යාලය ඉපැයූ ආදායම | | | | | | | - |
| අභ්‍යන්තර සිසුන්ගෙන් ලද ආදායම | 04 | - | 4,603,455 | 4,603,455 | - | 2,330,423 | 2,330,423 |
| ආයෝජන ආදායම් සහ ණය පොළිය | 05 | 8,113 | 14,191,284 | 14,199,397 | - | 4,758,838 | 4,758,838 |
| මිශ්‍ර ලැබීම් | 06 | 2,124,850 | 2,788,744 | 4,913,594 | 16,253 | 656,773 | 673,026 |
| බාහිර ව්‍යාපෘති ආදායම් | 07 | 60,935,027 | - | 60,935,027 | 15,470,587 | - | 15,470,587 |
| මුළු ආදායම | | **80,422,140** | **466,124,333** | **546,546,473** | **32,709,204** | **407,523,670** | **440,232,874** |
| අඩුකළා - වියදම් | | | | | | | |
| පුද්ගල පඩිනඩි | 08 | 17,825,027 | 344,313,094 | 362,138,121 | 17,642,236 | 360,973,269 | 378,615,505 |
| ගමන් වියදම් | 09 | 203,656 | 66,560 | 270,216 | 14,103 | 18,171 | 32,274 |
| සැපයීම් | 10 | 3,446,079 | 20,919,978 | 24,366,057 | 1,456,755 | 8,265,376 | 9,722,131 |
| නඩත්තු වියදම් | 11 | 1,447,608 | 10,424,717 | 11,872,325 | 649,198 | 11,179,739 | 11,828,937 |
| සේවා | 12 | 9,181,015 | 40,651,964 | 49,832,979 | 4,041,450 | 35,593,539 | 39,634,989 |
| වෙනත් | 13 | 98,934 | 41,747,474 | 41,846,408 | 54,702 | 35,660,406 | 35,715,108 |
| බාහිර ව්‍යාපෘති වියදම | 07 | 44,483,286 | - | 44,483,286 | 11,765,149 | - | 11,765,149 |
| මුළු වියදම | | **76,685,605** | **458,123,787** | **534,809,392** | **35,623,593** | **451,690,500** | **487,314,093** |
| ක්‍රමක්ෂය/ මූලධන ගැලපීම | 14 | 3,200,179 | 82,175,841 | 85,376,020 | 3,181,064 | 86,185,157 | 89,366,221 |
| අඩු කළා - ක්ෂයවීම් | | (3,522,011) | (82,425,765) | (85,947,776) | (3,375,283) | (86,185,157) | (89,560,440) |
| අතිරික්තය /ඌනතාවය | | **3,414,703** | **7,750,622** | **11,165,325** | **(3,108,608)** | **(44,166,830)** | **(47,275,438)** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **3. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර** | | |
| පුද්ගල පඩිනඩි සඳහා | 376,895,000 | 381,000,000 |
| වෙනත් වියදම් සඳහා | 85,000,000 | 36,000,000 |
| | **461,895,000** | **417,000,000** |
| **4. අභ්‍යන්තර සිසුන්ගෙන් ලද ආදායම** | | |
| ලියාපදිංචි ගාස්තු | 489,189 | 310,030 |
| ඉගැන්වීමේ ගාස්තු | 2,037,604 | 829,734 |
| විභාග ගාස්තු | 68,900 | 60,550 |
| නේවාසිකාගාර ගාස්තු | 2,007,762 | 1,130,109 |
| | **4,603,455** | **2,330,423** |
| **5. ආයෝජන ආදායම් සහ ණය පොලිය** | | |
| මහෝපාධ්‍යායය අරමුදල | 2,331,749 | 722,752 |
| බාහිර ව්‍යාපෘති | 11,753,760 | 3,878,874 |
| ණය හා අත්තිකාරම් පොලී | 113,888 | 157,212 |
| | **14,199,397** | **4,758,838** |
| **6. මිශ්‍ර ලැබීම්** | | |
| ඡායා පිටපත් ගාස්තු | 88,771 | 31,875 |
| ටෙන්ඩර් ගාස්තු | 26,000 | 10,000 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 610,000 | 83,000 |
| ආදායමට ගත් චෙක්පත් | 51,250 | 10,150 |
| වෙනත් | 38,142 | - |
| පුස්තකාලයේ පාඨක බලපත්‍ර නැවත ලබා ගැනීම | 4,950 | 3,750 |
| ශිෂ්‍ය වාර්තා පොත් ලබා ගැනීම | 3,000 | 500 |
| නැතිවූ ග්‍රන්ථ සඳහා | 3,561 | 515 |
| සහතික පත්‍ර ගාස්තු | 2,250 | - |
| අයදුම්පත් ගාස්තු | 191,188 | 293,500 |
| ලිපිගොනු කවර විකිණීම | 392 | - |
| උපාධි ප්‍රදානෝත්සවයේ ලියාපදිංචි ගාස්තු | 2,858,959 | 9,000 |
| පුස්තකාලයේ දඩ මුදල් | 3,119 | 1,363 |
| දේපලවලින් ලද ආදායම | 282,664 | 7,410 |
| ලංසු ලේඛන නිකුත් කිරීම | 18,000 | 157,000 |
| අයකරගත් ප්‍රමාද ගාස්තු | 19,959 | - |
| අලාභ හානි සඳහා අයකර ගැනීම | - | 9,540 |
| ගෙවිය යුතු පුනරාවර්ථන වියදම් | - | 2,800 |
| හඳුනා නොගත් බැර කිරීම් | 7,000 | 9,100 |
| ණයහිමි ගිණුම ආදායමට ගැනීම | - | 30,780 |
| විවෘත විශ්වවිද්‍යාලයේ Loyelty Payment සඳහා ලද මුදල | - | 3,900 |
| ප්‍රකාශන විකිණීම | 13,997 | - |
| ගර්භිත ද්‍රව්‍යයන්ගෙන් ලැබෙන ආදායම | 165,209 | - |
| මිශ්‍ර ලැබීම් පොදු | - | 8,843 |
| ශිෂ්‍ය හැඳුනුම්පත නැවත ලබා ගැනීම | 250 | - |
| වාහන නැවැත්වීමේ ගාස්තු | 40,350 | - |
| ශිෂ්‍ය සේවා තොරතුරු ලබා ගැනීම | 274 | - |
| උපාධි ලෝගු ප්‍රමාද ගාස්තු | 21,400 | - |
| උපාධි ලෝගු කුලී පදනම මත ලබා දීම | 16,200 | - |
| උපාධි ප්‍රදානෝත්සවය සඳහා අනුග්‍රහය දැක්වීම | 225,000 | - |
| නේවාසිකාගාර ගාස්තු කාර්යමණ්ඩලය | 221,709 | |
| | **4,913,594** | **673,026** |

සටහන 07

## පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ බාහිර පාඨමාලා අනුව සෑජු ආදායම් හා වියදම් විශ්ලේෂණය 2022

| | ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ව්‍යාපෘතිය | ශාස්ත්‍රවේදී බාහිර උපාධි | ඉංග්‍රීසි ඩිප්ලෝමා ව්‍යාපෘතිය | දෙමළ භාෂා පාඨමාලාව | බුද්ධ ධර්ම/ පාලි ඩිප්ලෝමා | බෞද්ධ උපදේශන පාඨමාලාව | කෙටිකාලීන පාඨමාලා | පශ්චාද් උපාධි පීඨය | එකතුව 2022 | එකතුව 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | | | | | | | | | | |
| මිශ්‍ර ලැබීම් | 277,265 | 1,696,685 | 100,750 | 74,950 | 437,902 | - | 145,000 | 21,400 | 2,753,952 | 1,376,706 |
| ලියාපදිංචි ගාස්තු | 463,068 | 19,131,550 | 139,500 | 173,000 | 2,246,682 | 57,500 | - | - | 22,211,300 | 1,187,413 |
| පාඨමාලා ගාස්තු | 8,567,773 | 7,944,415 | 2,067,150 | 1,996,950 | 2,480,750 | 329,750 | 2,591,500 | - | 25,978,288 | 7,483,407 |
| විභාග ගාස්තු | 489,000 | 5,071,250 | 197,500 | 247,200 | 609,400 | 6,000 | - | - | 6,620,350 | 4,366,757 |
| ප්‍රකාශන විකිණීම | 860 | 30,325 | 2,670 | 8,900 | 8,010 | - | - | - | 50,765 | 4,050 |
| පුස්තකාල ගාස්තු | 386,000 | - | 92,000 | 109,500 | 238,500 | 6,500 | - | - | 832,500 | 165,343 |
| ආයෝජන ආදායම් | 3,972 | - | - | - | - | - | - | - | 3,972 | 5,937 |
| උපදේශන ගාස්තු | 35,000 | - | - | - | - | - | - | 798,150 | 833,150 | 559,473 |
| සම්මන්ත්‍රණ ගාස්තු | 460,500 | 1,190,250 | - | - | - | - | - | - | 1,650,750 | 321,500 |
| **මුළු ආදායම** | **10,683,438** | **35,064,475** | **2,599,570** | **2,610,500** | **6,021,244** | **399,750** | **2,736,500** | **819,550** | **60,935,027** | **15,470,587** |
| අඩුකලා - වියදම් | | | | | | | | | | |
| දේශන ගාස්තු | 1,973,303 | 1,580,500 | 702,000 | 523,550 | 435,750 | - | 516,000 | - | 5,731,103 | 3,061,750 |
| විභාග වියදම් | 58,960 | 1,271,095 | 256,225 | 140,400 | 147,971 | - | 137,550 | 70,170 | 2,082,371 | 1,008,374 |
| අතිකාල දීමනා | 98,615 | 51,093 | 96,935 | 96,946 | 180,300 | - | - | 114,837 | 638,726 | 497,705 |
| සංග්‍රහ වියදම | 66,657 | 302,556 | 30,512 | 34,405 | 33,903 | 1,715 | - | 39,545 | 509,293 | 12,394 |
| වෙනත් වියදම් | - | - | - | - | - | - | - | - | - | 69,160 |
| පරිපාලන වියදම් | 747,953 | 12,646,000 | 431,400 | 444,000 | - | - | 759,000 | - | 15,028,353 | 2,102,950 |
| මුද්‍රණ දැන්වීම් | 41,918 | 225,536 | 252,169 | 238,415 | 173,846 | - | 198,723 | 292,394 | 1,423,001 | 1,364,467 |
| සම්මන්ත්‍රණ ගාස්තු | 400,100 | 1,185,750 | - | - | - | - | - | - | 1,585,850 | 191,075 |
| ගමන් වියදම් | - | - | - | - | - | - | - | - | - | 21,675 |
| දේශන ශාලා ගාස්තු | - | 675,000 | - | - | - | - | - | - | 675,000 | 70,000 |
| පාලකසභා අනුකමිටු ගාස්තු | - | - | - | - | - | - | - | - | - | 10,961 |
| සන්නිවේදන සේවා | - | - | - | - | - | - | - | - | - | 53,020 |
| අරමුදල් සඳහා වෙන් කිරීම | | | | | | | | | | |
| මහෝපාධ්‍යාය අරමුදල | 2,465,122 | 7,653,128 | 297,935 | 254,540 | - | - | 262,500 | - | 10,933,225 | 2,771,051 |
| පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල | 328,950 | 5,274,214 | - | 115,700 | - | - | 157,500 | - | 5,876,364 | 530,567 |
| **මුළු වියදම** | **6,181,578** | **30,864,872** | **2,067,176** | **1,847,956** | **971,770** | **1,715** | **2,031,273** | **516,946** | **44,483,286** | **11,765,149** |
| **අතිරික්තය / ඌනතාවය** | **4,501,860** | **4,199,603** | **532,394** | **762,544** | **5,049,474** | **398,035** | **705,227** | **302,604** | **16,451,741** | **3,705,438** |

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | 2022 | | 2021 |
|---|---|---|---|
| | රු | | රු |
| **පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ බාහිර ව්‍යාපෘති පාඨමාලාවල දළ අතිරික්තය** | | **16,451,741** | **3,705,438** |
| **පොදු ආදායම්** | | | |
| රජයේ ආධාර | 17,354,150 | | 17,222,364 |
| දේපලවලින් ලද ආදායම | 56,664 | | 7,410 |
| උපාධි ප්‍රදානෝත්සව ලියාපදිංචි ගාස්තු | 1,982,959 | | |
| මිශ්‍ර ලැබීම් | 85,226 | | 8,843 |
| මූලධන ප්‍රතිපාදන ආදායමට ගැලපීම (බාහිර ව්‍යාපෘති) | 3,200,179 | | 3,181,064 |
| ආයෝජන ආදායම | 8,113 | 22,687,291 | - |
| **ශුද්ධ ආදායම** | | **39,139,032** | **24,125,119** |
| **පොදු වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 17,812,427 | | 17,631,737 |
| යන්ත්‍ර ක්‍රියාකරු රාජකාරි | 12,600 | | 10,500 |
| ගමන් වියදම් | 203,656 | | 14,103 |
| සැපයීම් | 3,446,079 | | 1,446,755 |
| නඩත්තු වියදම් | 1,447,609 | | 593,340 |
| ගිවිසුම්ගත සේවා | 5,467,109 | | 1,134,291 |
| ආරක්ෂක සේවා | 1,814,703 | | 1,401,159 |
| පවිත්‍රතා සේවා | 1,899,203 | | 1,506,000 |
| පාලක සභා අනුකමිටු ගාස්තු | 48,064 | | 3,082 |
| විභාග වියදම් | 1,445 | | - |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 49,425 | | 117,478 |
| ක්ෂය | 3,522,011 | 35,724,331 | 3,375,283 |
| **ශුද්ධ අතිරික්තය/ ඌනතාව** | | **3,414,701** | **(3,108,609)** |
| **පසුගිය වර්ෂයේ ඉ/ගෙ ශේෂය** | **(1,613,551)** | | **1,495,058** |
| **ප/ගෙ ශේෂය** | **1,801,150** | | **(1,613,551)** |

බාහිර ව්‍යාපෘතිවල ආදායමෙන් රු.10,933,225/- මහෝපාධ්‍යාය අරමුදලටත් රු.5,876,364/-ක් පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලටත් වෙන් කර ඇත. එසේම බාහිර ව්‍යාපෘති ජංගම ගිණුමේ පවතින අතිරික්ත මුදල් ආයෝජනය කිරීමෙන් රු. 11,745,647.00ක පොලී ආදායමක් ලැබී ඇති අතර, එය පුනරාවර්තන වියදම් පියවා ගැනීමට විශ්වවිද්‍යාලයීය පුනරාවර්තන ගිණුමට ආදායමක් ලෙස බැර කර ඇත.

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **8. පුද්ගල පඩිනඩි** | | |
| වැටුප් හා වේතන | 116,379,187 | 120,353,888 |
| අර්ථසාධක අරමුදල් | 36,238,234 | 38,051,430 |
| සේ.නි.භා. අරමුදල් | 7,247,647 | 7,610,288 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 6,531,503 | 4,763,505 |
| අධ්‍යයන දීමනා | 83,951,746 | 91,098,225 |
| වෙනත් දීමනා (පීඨාධිපති, අංශ ප්‍රධාන දීමනා හා සංග්‍රහ දීමනා) | 2,759,893 | 2,108,228 |
| උපපාලක දීමනාව 10% | 228,565 | 225,073 |
| 5000/- දීමනාව | 10,160,976 | - |
| ජීවන වියදම් දීමනාව | 15,838,721 | 16,461,003 |
| පර්යේෂණ දීමනාව | 20,478,666 | 22,806,953 |
| එකතු කරන ලද මාසික දීමනාව | 49,812,739 | 50,699,586 |
| සේවා පාරිතෝෂික දීමනා | 9,598,348 | 20,909,121 |
| වෛද්‍යාධාර අරමුදල් දායකය | 2,805,846 | 3,437,555 |
| යන්ත්‍ර ක්‍රියාකරු රාජකාරී | 106,050 | 90,650 |
| | **362,138,121** | **378,615,505** |
| **9. ගමන් වියදම්** | | |
| දේශීය | 266,466 | 32,274 |
| විදේශීය | 3,750 | - |
| | **270,216** | **32,274** |
| **10.සැපයීම්** | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල පාරිභෝගික ද්‍රව්‍ය | 8,985,753 | 3,502,418 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 7,789,670 | 3,105,074 |
| නිල ඇඳුම් | 1,321,415 | 106,435 |
| වෛද්‍ය සැපයීම් | 79,638 | 27,582 |
| යන්ත්‍ර උපකරණ, වාහන අමතර කොටස් හා සුළු උපකරණ | 2,048,759 | 371,168 |
| වෙනත් සැපයීම් | 4,140,822 | 2,609,454 |
| | **24,366,057** | **9,722,131** |
| **11.නඩත්තු වියදම්** | | |
| වාහන | 2,882,567 | 2,116,395 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 3,956,007 | 4,275,920 |
| ගොඩනැගිලි නඩත්තු | 1,846,134 | 2,870,573 |
| වෙබ් අඩවි හා මෘදුකාංග නඩත්තු | 3,187,617 | 2,566,049 |
| | **11,872,325** | **11,828,937** |
| **12. සේවා** | | |
| ප්‍රවාහන | 2,461,763 | 2,196,774 |
| විදුලි සංදේශ සේවා | 3,997,051 | 1,641,825 |
| තැපැල් ගාස්තු | 710,200 | 322,969 |
| විදුලිය හා ජලය | 9,453,358 | 7,237,998 |
| ආරක්ෂක සේවා | 18,007,193 | 15,058,383 |
| පවිත්‍රතා සේවා | 15,203,414 | 13,177,040 |
| | **49,832,979** | **39,634,989** |

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **13. වෙනත්** | | |
| බාහිර කථිකාචාර්ය දීමනා | 10,243,831 | 8,668,211 |
| ශිෂ්‍යාධාර | 18,008,100 | 16,855,600 |
| මහපොල ශිෂ්‍යත්ව භාණ්ඩාගාර දායකය | 548,800 | 2,129,050 |
| දැන්වීම් ගාස්තු | 1,152,464 | 1,815,097 |
| වැඩමුළු සම්මන්ත්‍රණ හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා සංවර්ධනය | 223,074 | 222,566 |
| විගණන ගාස්තු | 816,000 | 897,600 |
| පාලක සභා සහ අනුකමිටු ගාස්තු | 2,242,270 | 1,399,491 |
| විභාග වියදම් | 2,717,285 | 1,702,167 |
| උපාධි ප්‍රදානෝත්සවයේ ගාස්තු | 3,352,738 | - |
| දායක මුදල් හා සාමාජික මුදල් | 971,257 | 596,714 |
| නිවාඩු ගමන් බලපත්‍ර ගාස්තු | 264,225 | 18,180 |
| නීති වියදම් | 240,750 | 51,750 |
| භාෂා පරිවර්තන ගාස්තු | 187,158 | 186,487 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 459,554 | 1,107,315 |
| විකුණුම් / පරිත්‍යාග ග්‍රන්ථවල පිරිවැය | - | 13,260 |
| විනය පරීක්ෂණ ගාස්තු | 353,820 | |
| කල් ඉකුත් වූ ද්‍රව්‍ය ලියා හැරීම හා තොග හානි ඉවත් කිරීම | 505 | - |
| Thermo Meter Repair | - | 500 |
| රක්ෂණ මාර්ගස්ථ මුදල් | 63,711 | 51,120 |
| බැංකු ගාස්තු | 866 | |
| | **41,846,408** | **35,715,108** |

| | 2022 | 2021 |
|---|---|---|
| **14. මූලධන ගැලපීම්** | | |
| මූලධන ප්‍රතිපාදන ආදායමට ගැලපීම | 68,604,678 | 70,139,254 |
| නිපුණතා සංවර්ධනය ලියා හැරීම ආදායමට ගැලපීම | 1,424,079 | 2,440,561 |
| ප්‍රාග්ධන පරිත්‍යාග ආදායමට ගැලපීම | 15,347,263 | 16,786,406 |
| | **85,376,020** | **89,366,221** |

15.දේපල පිරියත හා උපකරණ

| පිරිවැය/ප්‍රත්‍යාගණිත වටිනාකම | 2022.01.01 ඉ/ ගෙ ශේෂය රු. | එකතු කිරීම රු. | ගැලපීම රු. | 2022.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 1,256,445,143 | 12,668,757 | - | 1,269,113,900 |
| ඉඩම් | 395,743,750 | - | (43,750) | 395,700,000 |
| දැව භාණ්ඩ | 79,710,032 | 1,485,475 | - | 81,195,507 |
| උපකරණ | 164,633,355 | 20,247,935 | - | 184,881,290 |
| වාහන | 11,462,205 | - | - | 11,462,205 |
| රජයේ ප්‍රතිපාදන ගිණුම- වාහන | 45,690,000 | - | - | 45,690,000 |
| පොත්පත් හා වාර සඟරා | 25,170,330 | 528,706 | - | 25,699,036 |
| උපාධි ලෝගු සහ ශාටක | 7,040,878 | - | - | 7,040,878 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - උපකරණ | 22,659,966 | - | - | 22,659,966 |
| **එකතුව** | **2,008,555,659** | **34,930,873** | **(43,750)** | **2,043,442,782** |

| සමුච්චිත ක්ෂය | 2022.01.01 ඉ/ ගෙ ශේෂය රු. | වර්ෂයේ ක්ෂය රු. | ගැලපීම රු. | 2022.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 339,649,497 | 63,357,029 | - | 403,006,526 |
| ඉඩම් | - | - | - | - |
| දැව භාණ්ඩ | 52,740,526 | 5,203,354 | 22,209 | 57,966,089 |
| උපකරණ | 139,942,620 | 13,778,869 | (1,301) | 153,720,188 |
| වාහන | 11,462,200 | - | - | 11,462,200 |
| රජයේ ප්‍රතිපාදන ගිණුම- වාහන | 45,689,999 | - | - | 45,689,999 |
| පොත්පත් හා වාර සඟරා | 22,926,784 | 938,764 | - | 23,865,548 |
| උපාධි ලෝගු සහ ශාටක | 4,683,817 | 448,360 | - | 5,132,177 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - උපකරණ | 21,165,972 | 722,922 | - | 21,888,894 |
| **එකතුව** | **638,261,415** | **84,449,298** | **20,908** | **722,731,621** |
| ශුද්ධ අගය | **1,370,294,244** | | | **1,320,711,161** |

16.අස්පෘශ්‍ය වත්කම්

| පිරිවැය/ප්‍රත්‍යාගණිත වටිනාකම | 2022.01.01 ඉ/ ගෙ ශේෂය රු. | එකතු කිරීම රු. | ඉවත් කිරීම රු. | 2022.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| මෘදුකාංග සංවර්ධනය | 372,000 | 82,950 | - | 454,950 |
| නිපුණතා සංවර්ධනය | 38,389,336 | 732,377 | - | 39,121,713 |
| | **38,761,336** | **815,327** | **-** | **39,576,663** |

| සමුච්චිත ක්ෂය | 2022.01.01 ඉ/ ගෙ ශේෂය රු. | වර්ෂයේ කපාහැරීම් රු. | ඉවත් කිරීම් මත ක්ෂය ගැලපීම රු. | 2022.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| මෘදුකාංග සංවර්ධනය | 74,400 | 74,400 | - | 148,800 |
| නිපුණතා සංවර්ධනය | 32,720,345 | 1,424,079 | - | 34,144,424 |
| | **32,794,745** | **1,498,479** | **-** | **34,293,224** |
| ශුද්ධ අගය | **5,966,591** | | | **5,283,439** |

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **17.කෙරීගෙන යන වැඩ** | | |
| නේවාසිකාගාර උප පාලක නිල නිවස ඉදිකිරීම II | - | 10,272,523 |
| පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම -කොළඹ පරිශ්‍රය | 548,902 | 548,902 |
| විදේශීය සිසුන් සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරීම | 154,008,307 | 146,384,485 |
| | **154,557,209** | **157,205,910** |
| **18.ආයෝජන** | | |
| බාහිර ව්‍යාපෘති අරමුදල - ස්ථාවර තැන්පත් | 105,100,000 | 73,262,500 |
| ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල - ස්ථාවර තැන්පත් | 10,461,060 | 8,461,060 |
| වෛද්‍යාධාර අරමුදල - ස්ථාවර තැන්පත් | 13,798,700 | 12,774,896 |
| මහෝපාධ්‍යාය අරමුදල - ස්ථාවර තැන්පත් | 23,773,525 | 22,860,000 |
| ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල- ස්ථාවර තැන්පත් | 1,300,000 | 1,300,000 |
| පර්යේෂණ ප්‍රකාශන හා කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධන අරමුදල- ස්ථාවර තැන්පත් | 10,240,536 | 10,240,536 |
| Glorious Sun භාෂා නිපුණතා සංවර්ධන අරමුදල ස්ථාවර තැන්පත් | 2,527,500 | 2,527,500 |
| ශිෂ්‍ය සුභසාධන අරමුදල - ස්ථාවර තැන්පත් | 2,690,827 | 2,630,500 |
| පූජ්‍ය ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව භාර අරමුදල ස්ථාවර තැන්පත් | 1,000,000 | - |
| මහාචාර්ය තෙලුවේ සුමනවංස අභිනන්දන අරමුදල ස්ථාවර තැන්පත් | 580,000 | - |
| Shinnyo.en Shinso Ito ශිෂ්‍යත්ව භාර අරමුදල ස්ථාවර තැන්පත් | 10,000,000 | - |
| | **181,472,148** | **134,056,992** |
| **19. ගබඩාවේ ඉතිරි තොගය** | | |
| 2022.01.01 දිනට ඉ/ගෙ ශේෂය | 5,423,927 | 7,088,923 |
| **එකතු කළා: වර්ෂය තුළ එකතු කිරීම්** | 19,500,359 | 4,451,011 |
| | 24,924,286 | 11,539,934 |
| **අඩු කළා: වර්ෂය තුළ නිකුත් කිරීම්** | (16,186,187) | (6,117,960) |
| | 8,738,099 | 5,421,974 |
| **ලියාහැරීම්/ ගැලපීම්** | (684) | 1,953 |
| | **8,737,415** | **5,423,927** |
| **20.ප්‍රකාශන තොගය** | | |
| ප්‍රකාශන තොගය | | |
| 2022.01.01 දිනට ඉ/ගෙ ශේෂය | 408,450 | 421,710 |
| **අඩුකළා: විකුණූ/ පරිත්‍යාග ග්‍රන්ථවල පිරිවැය** | - | (13,260) |
| | **408,450** | **408,450** |
| සාහිත්‍ය සංකථන | | |
| 2022.01.01 දිනට ඉ/ගෙ ශේෂය | 1,288,509 | 1,292,215 |
| එකතුකළා: ගැලපීම | 73,467 | |
| **අඩුකළා: විකුණූ/ පරිත්‍යාග ග්‍රන්ථවල පිරිවැය (වැය වූ මූලධන ආධාරවලින් ගලපා ඇත.)** | (1,361,976) | **(3,706)** |
| | - | **1,288,509** |
| 2022.12.31 දිනට ඉ/ගෙ ශේෂය | **408,450** | **1,696,959** |

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **21.කෙටිකාලීන ආයෝජන** | | |
| ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල- ඉතිරි කිරීමේ තැන්පත් | 642,020 | 2,137,224 |
| වෛද්‍යාධාර අරමුදල-ඉතිරි කිරීමේ තැන්පත් | 199,721 | 137,411 |
| මහෝපාධ්‍යාය අරමුදල - ඉතිරි කිරීමේ තැන්පත් | 928,594 | 2,167,597 |
| පීයුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල | | |
| ස්ථාවර තැන්පත් (ත්‍රෛමාසික) | 580,000 | 580,000 |
| -එම- ඉතිරි කිරීමේ තැන්පත් | 283,625 | 153,805 |
| පර්යේෂණ ප්‍රකාශන හා කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධන අරමුදල | | |
| ස්ථාවර තැන්පත් (මාසික) | - | 1,500,000 |
| -එම- ඉතිරි කිරීමේ තැන්පත් | 1,325,857 | 861,721 |
| Glorious Sun භාෂා නිපුණතා සංවර්ධන අරමුදල ඉතිරිකිරීමේ තැන්පත් | 592,130 | 619,727 |
| ශිෂ්‍ය සුභසාධන අරමුදල - ඉතිරිකිරීමේ තැන්පත් | 335,086 | 260,208 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ව්‍යාපෘති ස්ථාවර තැන්පත් (සයමාසික) | 110,000 | 110,000 |
| මහාචාර්ය තෙලුවේ සුමනවංස අභිනන්දන අරමුදල ඉතිරිකිරීමේ තැන්පත් | 129,589 | - |
| | **5,126,622** | **8,527,693** |
| **22.සේවක ණය හා විවිධ අත්තිකාරම්** | | |
| උත්සව අත්තිකාරම් | 1,250 | - |
| තැපැල් අත්තිකාරම් | 77,180 | 36,485 |
| තැපැල් අත්තිකාරම් (බාහිර) | 79,080 | 24,089 |
| ආපදා ණය | 7,663,425 | 9,204,370 |
| ලැබිය යුතු වැට් බදු මුදල | 38,379 | 88,379 |
| මූලික ගෙවීම | - | 316,330 |
| | **7,859,314** | **9,669,653** |
| **23.විවිධ තැන්පත්** | | |
| සේවා තැන්පත් | 783,450 | 583,450 |
| ගෑස් සිලින්ඩර් සඳහා තැන්පතු | 9,100 | 9,100 |
| | **792,550** | **592,550** |
| **24.මූලධන අත්තිකාරම්** | | |
| ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 90,852 | 90,852 |
| Arthur C. Clarke Institute for Modern Technology | 1,189,000 | 140,000 |
| කේ.එස්.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 14,508,833 | 14,508,833 |
| | **15,788,685** | **14,739,685** |
| **25.ලැබිය යුතු පොලී** | | |
| වෛද්‍යාධාර අරමුදල | 728,275 | 214,835 |
| ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල | 413,082 | 249,738 |
| පීයුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල | 147,064 | 41,597 |
| මහෝපාධ්‍යායය අරමුදල | 1,718,090 | 464,577 |
| ශිෂ්‍ය සුභසාධන අරමුදල | 225,369 | 85,189 |
| Glorious Sun භාෂා නිපුණතා සංවර්ධන අරමුදල | 272,555 | 93,691 |
| පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල | 810,822 | 263,637 |
| බාහිර ව්‍යාපෘති | 8,897,269 | 1,709,895 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ව්‍යාපෘතිය | 1,658 | 575 |
| | 21,071 | - |
| පූජ්‍ය ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව භාර අරමුදල | 27,173 | - |
| Shinnyo.en Shinso Ito ශිෂ්‍යත්ව භාර අරමුදල | 28,493 | - |
| | **13,290,921** | **3,123,734** |

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **26.කලින් ගෙවීම්** | | |
| වාර්ෂික සේවා ගිවිසුම් ගාස්තු | 1,350,163 | 550,552 |
| වාහන රක්‍ෂණ ගාස්තු | 211,914 | 179,188 |
| දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ගාස්තු | - | 9,660 |
| ආදායම් බලපත්‍ර ගාස්තු | 238,613 | 41,547 |
| සම්මාදම් දායක මුදල් හා සාමාජික මුදල් (විදේශීය) | - | 250,212 |
| පුවත්පත්ත දැන්වීම් (බාහිර උපාධි පාඨමාලා) | 857,222 | - |
| | **2,657,912** | **1,031,159** |

| | 2022 | 2021 |
|---|---|---|
| **27.මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ***I. භාණ්ඩාගාර අරමුදල්*** | | |
| ලංකා බැංකුව හෝමාගම (පුනරාවර්තන) 711201 | 2,366,807 | 7,272,982 |
| ලංකා බැංකුව හෝමාගම (මූලධන) 711534 | 28,963,202 | 50,063,638 |
| ***II. භාණ්ඩාගාර අරමුදල් නොවන*** | | |
| ලංකා බැංකුව හෝමාගම (බාහිර විභාග හා පශ්චාද් උපාධි) 711202 | 3,697,215 | 3,895,531 |
| ලංකා බැංකුව හෝමාගම 007287 3383 | 77,242 | 416,762 |
| ලංකා බැංකුව හෝමාගම 0077269741 | 39,905 | 39,905 |
| ඇ.එ.ජ. ඩොලර් ගිණුම 89732479 | 774,509 | |
| | **35,918,880** | **61,688,818** |

| | 2022 | 2021 |
|---|---|---|
| **28. වැය නොවූ මූලධන ආධාර** | | |
| 2022.12.31 දිනට මුදල් ශේෂය | 28,963,202 | 50,063,638 |
| **එකතු කළා** | | |
| 2022.12.31 දිනට මූලධන අත්තිකාරම් | 15,788,685 | 14,739,685 |
| ලැබිය යුතු මූලධන වියදම් | - | 78,000 |
| **අඩු කළා** | | |
| ආදායමට ගත් චෙක්පත් | - | (19,090) |
| 2022.12.31 දිනට කොන්ත්‍රාත් මත රදවාගැනීම් | 10,905,401 | (11,211,626) |
| **වැය නොවූ මූලධන ආධාර** | **33,846,486** | **53,650,607** |

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **29.ප්‍රාග්ධන පරිත්‍යාග** | | |
| **පොත්පත්** | | |
| 2022.01.01 දිනට ශේෂය | 268,503 | 511,206 |
| 2022 වර්ෂය තුළ ලද පරිත්‍යාග | 125,338 | 75,880 |
| | 393,841 | 587,086 |
| **අඩුකළා** | | |
| ප්‍රාග්ධන පරිත්‍යාග ලියාහැරීම් | (231,395) | (318,583) |
| | **162,446** | **268,503** |
| **ගොඩනැගිලි** | | |
| 2022.01.01 දිනට ශේෂය | 154,916,774 | 165,916,781 |
| 2022 වර්ෂය තුළ ලද පරිත්‍යාග | - | - |
| | 154,916,774 | 165,916,781 |
| **අඩුකළා** | | |
| ප්‍රාග්ධන පරිත්‍යාග ලියාහැරීම් | 11,000,007 | (11,000,007) |
| | **143,916,767** | **154,916,774** |
| **උපකරණ** | | |
| 2022.01.01 දිනට ශේෂය | 4,100,861 | 9,568,676 |
| 2022 වර්ෂයට ලද පරිත්‍යාග | 900,000 | - |
| | 5,000,861 | 9,568,676 |
| **අඩුකළා** | | |
| ප්‍රාග්ධන පරිත්‍යාග ලියාහැරීම් | 4,115,861 | (5,467,815) |
| | **885,000** | **4,100,861** |
| | **144,964,213** | **159,286,138** |

| | 2022 | 2021 |
|---|---|---|
| **30.සංචිත අරමුදල්** | | |
| ශිෂ්‍යත්ව හා ත්‍යාග | 11,516,162 | 10,848,022 |
| වෛද්‍යාධාර | 13,998,421 | 12,912,307 |
| මහෝපාධ්‍යාය | 28,958,397 | 31,221,750 |
| ජීයුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන | 2,491,698 | 2,256,411 |
| පර්යේෂණ ප්‍රකාශන හා කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධන | 12,377,215 | 12,865,894 |
| පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි නාහිමි ස්ථාපිත ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය විශ්‍රාම | - | 5,000 |
| Glorious Sun භාෂා නිපුණතා සංවර්ධන | 3,392,184 | 3,162,917 |
| ශිෂ්‍ය සුභසාධන | 3,251,281 | 2,975,897 |
| මහාචාර්ය නෙලුවේ සුමනවංස අභිනන්දන අරමුදල | 730,659 | - |
| පූජ්‍ය ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව භාර අරමුදල | 1,027,173 | - |
| Shinnyo.en Shinso Ito ශිෂ්‍යත්ව භාර අරමුදල | 10,028,493 | - |
| | **87,771,683** | **76,248,198** |

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **31. සේවා පාරිතෝෂික දීමනා වෙන් කිරීම** | | |
| 2022.01.01 දිනට ශේෂය | 112,221,401 | 94,410,664 |
| **එකතු කළා:** | | |
| වර්ෂය තුළ එකතු කිරීම් | 9,598,348 | 20,909,121 |
| | **121,819,749** | **115,319,785** |
| **අඩු කළා:** | | |
| වර්ෂය තුළ කළ ගෙවීම් | (17,312,304) | (3,098,384) |
| | **104,507,445** | **112,221,401** |

**32.විලම්භිත ආදායම්**

| | 2022 | 2021 |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (ප්‍රථම) බාහිර උපාධි | 26,673,500 | 20,141,250 |
| දෙමළ පාඨමාලා ව්‍යාපෘතිය | 40,500 | 5,000 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 103,000 | 2,602,095 |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 29,500 | 2,500 |
| බුද්ධ ධර්ම/ පාලි ඩිප්ලෝමා | 4,652,750 | - |
| දහම් සරසවිය | 4,022,595 | - |
| බෞද්ධ උපදේශන පාඨමාලාව | 18,750 | - |
| පශ්චාද් උපාධි පීඨය | 2,542,900 | 884,000 |
| | **38,083,495** | **23,634,845** |

**33.තැන්පත්**

| | 2022 | 2021 |
|---|---|---|
| ආරක්ෂක ඇප තැන්පත් | 260,630 | 230,630 |
| නේවාසික තැන්පත් | 2,786,100 | 2,698,100 |
| පුස්තකාල තැන්පත් | 2,970,328 | 2,304,193 |
| පුස්තකාල තැන්පත් (පශ්චාද් උපාධි පීඨය) | 281,740 | 257,740 |
| | **6,298,798** | **5,490,663** |

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **34. කොන්ත්‍රාත්මත රඳවාගැනීම්** | | |
| ඇක්විල් හෝම්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | 32,051 | 32,051 |
| එස්. එම්. කන්ස්ට්‍රක්ෂන්ස් | 68,173 | 6,659 |
| සොයුල් බිල්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් | 164,707 | 164,707 |
| ප්‍රභාත් ස්ටීල් ෆර්නිචර්ස් | - | 94,050 |
| සුකීත් ඩිසයින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | 468,991 | 910,508 |
| ලංකා සළුසල ලිමිටඩ් | - | 9,108 |
| අයි.කේ.එල්. ඉංජිනියර්ස් | 176,568 | 133,866 |
| සෙන්ට්‍රල් සප්ලයර්ස් (පුද්) සමාගම | 9,506,750 | 9,506,750 |
| රුවන් ට්‍රේඩ් සෙන්ටර් | 53,092 | 53,092 |
| ඇලු වී ග්ලාස් ඉංජිනියරින් | 6,807 | 6,808 |
| ශ්‍රී ලංකා රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | 95,900 | 210,812 |
| ලීමා ක්‍රියේෂනස් (පුද්) සමාගම | 17,028 | 17,028 |
| සඳකැන් කන්ස්ට්‍රක්ෂන්ස් | 7,750 | 3,750 |
| එච්.ඇන්ඩ්.එන්. ඉන්ජිනියරින් කන්ස්ට්‍රක්ෂන්ස් | 73,818 | 73,817 |
| සක්සස් කන්ස්ට්‍රක්ෂන්ස් | - | 70,712 |
| ආලෝකා ඇඩ්වර්ටයිසන් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | - | 2,900 |
| ෆයිව් ස්ටාර් ටෙක්ස්ටයිල් සෙන්ටර් | 8,114 | 8,114 |
| චාමිකර ඉන්ජිනියරින් සර්විසස් | 31,645 | - |
| බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 70,322 | 70,322 |
| ලලන්ස් ස්පෝර්ට්ස් ගුඩ්ස් මැනුෆැක්චරස් | 27,320 | - |
| ක්‍රාෆ්ට් ලංකා ඉංජිනියරින් පුද්ගලික සමාගම | 279,481 | - |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 37,200 | 37,200 |
| | **11,125,717** | **11,412,254** |

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

2022.12.31 දිනට කොන්ත්‍රාත් රඳවා ගැනීමේ කාල විශ්ලේෂණය

| අනු අංකය | ආයතනයේ නම | ප්‍රවර්තන වර්ෂයේ රඳවා ගැනීම් 2022 | 2021 වර්ෂයේ රඳවා ගැනීම් | 2020 වර්ෂයේ රඳවා ගැනීම් | 2019 වර්ෂයේ රඳවා ගැනීම් | 2018 හා ඊට පෙර වර්ෂවල රඳවා ගැනීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | එස්.එම්. කන්ස්ට්‍රක්ෂන්ස් | 61,514 | 6,659 | | | | 68,173 |
| 2 | බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | | | 70,322 | | | 70,322 |
| 3 | ඇක්විල් හෝම්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | | | | | 32,051 | 32,051 |
| 4 | සෙන්ට්‍රල් සප්ලයර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | | 3,158,128 | 6,348,622 | | | 9,506,750 |
| 5 | සුකිත් ඩිසයින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | | 154,965 | | 91,914 | 222,112 | 468,991 |
| 6 | රුවන් ට්‍රේඩ් සෙන්ටර් | | 43,433 | | | 9,659 | 53,092 |
| 7 | සොයුල් බිල්ට් ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් | | 164,707 | | | | 164,707 |
| 8 | ඇලු වී ග්ලාස් ඉංජිනියරින් | | | | | 6,807 | 6,807 |
| 9 | ශ්‍රී ලංකා රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | | | | 95,900 | | 95,900 |
| 10 | ලීමා ක්‍රියේෂනස් (පුද්) සමාගම | | | | | 17,028 | 17,028 |
| 11 | එච්.ඇන්ඩ්.එන්. ඉන්ජිනියරින් කන්ස්ට්‍රක්ෂන්ස් | | | 63,012 | 10,806 | | 73,818 |
| 12 | ෆයිව් ස්ටාර් ටෙක්ස්ටයිල් සෙන්ටර් | | | 8,114 | | | 8,114 |
| 13 | චාමිකර ඉන්ජිනියරින් සර්විසස් | 31,645 | | | | | 31,645 |
| 14 | අයි.කේ.එල් ඉන්ජිනියර්ස් | 176,568 | | | | | 176,568 |
| 15 | සඳකැන් කන්ස්ට්‍රක්ෂන්ස් | 4,000 | 3,750 | | | | 7,750 |
| 16 | ලලාන්ස් ස්පෝට්ස් ගුඩ්ස් මැනුෆැක්චරස් | 27,320 | | | | | 27,320 |
| 17 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | | | 37,200 | | | 37,200 |
| 18 | ක්‍රාෆ්ට් ලංකා ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් | 279,481 | | | | | 279,481 |
| | **රඳවා ගැනීමේ මුළු එකතුව** | **580,528** | **3,531,642** | **6,527,270** | **198,620** | **287,657** | **11,125,717** |

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **35.විවිධ ණය හිමියෝ** | | |
| මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල | 1,676,425 | 537,575 |
| ගෙවිය යුතු පුනරාවර්තන වියදම් | 400 | 400 |
| ගාමිණී ජයසූරිය ශිෂ්‍යත්ව අරමුදල | 5,000 | - |
| ගෙවිය යුතු ආදායම | 6,822 | - |
| | **1,688,647** | **537,975** |
| **36.උපචිත වියදම්** | | |
| වැටුප් හා වේතන | 96,250 | 437,700 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 455,746 | 443,217 |
| වෙනත් දීමනා | 241,630 | 162,021 |
| ගමන් වියදම් - දේශීය | 6,354 | 3,625 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 292,080 | 110,695 |
| වෙනත් සැපයීම් | 56,090 | 72,510 |
| අලුත්වැඩියා නඩත්තු (වාහන) | 51,281 | 158,912 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ | 22,750 | 100,000 |
| විදුලි සංදේශ සේවා | 38,350 | 584,837 |
| විදුලිය හා ජලය | 645,847 | 505,616 |
| ආරක්ෂක සේවා | 4,596,837 | 1,137,443 |
| පවිත්‍රතා සේවා | 3,705,271 | 1,400,000 |
| බාහිර කථිකාචාර්ය දීමනා | 4,867,290 | 3,383,100 |
| නිවාඩු ගමන් බලපත්‍ර | 25,800 | - |
| පාලක සභා හා අනුකමිටු ගාස්තු | 241,800 | 250,000 |
| විභාග වියදම් | 89,500 | 625,530 |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල පාරිභෝගික ද්‍රව්‍ය | 3,000 | - |
| යන්ත්‍ර ක්‍රියාකරු රාජකාරි | 42,000 | 80,150 |
| විගණන ගාස්තු | 2,122,130 | 2,122,130 |
| මුද්‍රිත දැන්වීම් | - | 471,744 |
| නිල ඇඳුම් | 12,600 | - |
| වෙබ් අඩවි හා මෘදුකාංග නඩත්තු | 629,474 | 360,532 |
| ශිෂ්‍යාධාර | 1,824,000 | 3,156,000 |
| ඉඩම් සඳහා ගෙවිය යුතු මුදල | 200,000 | 243,750 |
| මහපොළ- භාණ්ඩාගාර දායකය | 171,500 | 521,850 |
| විනය පරීක්ෂණ ගාස්තු | 345,150 | - |
| | **20,782,730** | **16,331,362** |
| **37.උපචිත වියදම් - බාහිර ව්‍යාපෘති** | | |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ව්‍යාපෘතිය | 9,703,680 | 5,998,341 |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා ව්‍යාපෘතිය | 4,745,088 | 4,445,426 |
| බුද්ධ ධර්ම/ පාලි ඩිප්ලෝමාව | 4,265,727 | 5,178,352 |
| ශාස්ත්‍රවේදී ප්‍රථම (බාහිර) උපාධි | 43,526,237 | 19,843,152 |
| දහම් සරසවි පාඨමාලාව | 1,949,958 | 2,014,783 |
| දෙමළ පාඨමාලාව | 3,703,015 | 3,276,840 |
| බෞද්ධ උපදේශනය | 320,400 | 549,650 |
| පොදු | 2,553,207 | 1,874,441 |
| භාෂා පාඨමාලාව | - | 667,500 |
| පශ්චාද් උපාධි පීඨය | 202,425 | 254,055 |
| කෙටිකාලීන පාඨමාලා | 1,832,550 | - |
| | **72,802,287** | **44,102,540** |

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## පස් වසරක මූල්‍ය තොරතුරු

### ආදායම් හා වියදම් විශ්ලේෂණය

| විස්තරය | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර | 461,895,000 | 417,000,000 | 445,499,000 | 424,688,000 | 308,300,000 |
| අන්තර්ජාතික ථේරවාදී බෞද්ධ සම්මේලනය සඳහා රජයෙන් ලැබූ ආධාර | | | - | - | 6,200,000 |
| විශ්වවිද්‍යාලය ඉපැයූ ආදායම | | | - | - | |
| අභ්‍යන්තර සිසුන්ගෙන් ලද ආදායම | 4,603,455 | 2,330,423 | 4,638,487 | 3,578,743 | 5,221,748 |
| ආයෝජන ආදායම් සහ ණය පොළිය | 14,199,397 | 4,758,838 | 7,515,703 | 6,889,298 | 5,304,995 |
| මිශ්‍ර ලැබීම් | 4,913,594 | 673,026 | 1,959,556 | 11,962,932 | 11,413,257 |
| බාහිර ව්‍යාපෘති ආදායම් | 60,935,027 | 15,470,587 | 41,771,287 | 53,222,073 | 51,717,109 |
| අන්තර්ජාතික ථේරවාදී බෞද්ධ විශ්වවිද්‍යාල සංගමයෙන් (IATBU) ලැබූ ආධාර | | - | - | 52,785 | 8,428,125 |
| මුළු ආදායම | **546,546,473** | **440,232,874** | **501,384,033** | **500,393,831** | **396,585,234** |
| <u>අඩුකළා - වියදම්</u> | | | | | |
| පුද්ගල පඩිනඩි | 362,138,121 | 378,615,505 | 372,705,968 | 390,484,046 | 243,234,951 |
| ගමන් වියදම | 270,216 | 32,274 | 247,697 | 1,454,824 | 2,251,193 |
| සැපයීම් | 24,366,057 | 9,722,131 | 11,257,643 | 15,884,609 | 13,072,303 |
| නඩත්තු වියදම් | 11,872,325 | 11,828,937 | 8,319,126 | 8,774,484 | 7,809,255 |
| සේවා | 49,832,979 | 39,634,989 | 36,336,052 | 41,363,857 | 40,538,196 |
| වෙනත් | 41,846,408 | 35,715,108 | 26,260,325 | 39,132,569 | 31,391,377 |
| බාහිර ව්‍යාපෘති වියදම | 44,483,286 | 11,765,149 | 35,372,123 | 42,892,161 | 46,773,684 |
| ථේරවාදී බෞද්ධ සම්මේලනය -2018 | | | - | 19,090 | 12,773,062 |
| මුළු වියදම | **534,809,392** | **487,314,093** | **490,498,934** | **540,005,640** | **397,844,021** |
| ක්‍රමක්ෂය/ මූලධන ගැලපීම | 85,376,020 | 89,366,221 | 94,335,852 | 84,119,096 | 83,048,675 |
| අඩු කළා - ක්ෂයවීම් | (85,947,776) | (89,560,440) | (95,194,136) | (85,295,176) | (83,977,255) |
| අතිරික්තය / ඌනතාවය | **11,165,325** | **(47,275,438)** | **10,026,815** | **(40,787,889)** | **(2,187,367)** |

### පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| | | | | | |
|---|---|---|---|---|---|
| දළ අතිරික්තය (අරමුදල් සඳහා වෙන් කිරීමෙන් පසු) | 16,451,741 | 3,705,438 | 6,399,164 | 10,329,912 | 4,943,425 |
| දළ අතිරික්තයේ ප්‍රතිශතය | 27% | 24% | 15% | 19% | 10% |
| අරමුදල්වලට වෙන් කිරීම | 16,809,589 | 3,301,618 | 11,309,410 | 12,293,127 | 14,627,905 |

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොරතුරු විශ්ලේෂණය

| | | | | | |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 1,662,023,957 | 1,667,523,737 | 1,573,540,076 | 1,567,854,200 | 1,419,199,119 |
| ජංගම වත්කම් | 90,580,749 | 106,494,178 | 147,748,863 | 117,477,860 | 98,913,834 |
| ජංගම වගකීම් | 150,781,674 | 101,509,639 | 81,259,732 | 78,532,486 | 57,944,783 |
| සංචිත හා ජංගම නොවන වගකීම් | 337,243,341 | 347,755,737 | 351,259,372 | 360,112,688 | 310,121,663 |
| ශුද්ධ වත්කම් | 1,264,579,691 | 1,324,752,539 | 1,288,769,835 | 1,246,686,886 | 1,150,046,507 |

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය

## අර්ථසාධක අරමුදල

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2022 | | 2021 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 01. ආදායම් | | | | |
| ස්ථාවර තැන්පත් පොලී | | 54,951,571 | | 21,587,315 |
| ණයහිමි ආයෝජන පොලී | | 258,137 | | 113,942 |
| සත්දින නිවේදන තැන්පත් පොලී | | 56,082 | 55,265,790 | |
| දළ ආදායම | | | **55,265,790** | **21,701,257** |
| 02. අඩු කළා : වියදම් | | | | |
| විගණන ගාස්තු | | 87,960 | | 111,240 |
| ආයෝජන කමිටු හා වෙනත් කමිටු ගාස්තු | | 84,859 | | 50,602 |
| වෙනත් වියදම් | | - | 172,819 | 400 |
| බදු පෙර ආදායම | | | **55,092,971** | **21,539,015** |
| අඩු කළා : | | | | |
| වර්ෂයේ ආදායම් බදු | | | 7,713,016 | 3,015,462 |
| බදු පසු ආදායම | | | **47,379,955** | **18,523,553** |
| එකතු කළා : | | | | |
| පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | 11 | 11 |
| | | | **47,379,966** | **18,523,564** |
| එකතු කළා : | | | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | - | |
| | | | **47,379,966** | **18,523,564** |
| අඩු කළා : | | | | |
| විසර්ජනයන් | | | | |
| දායක ගිණුම් සඳහා පොලී | 02 | | **47,157,958** | **18,425,563** |
| ශුද්ධ ණයහිමි ආයෝජන ආදායම සඳහා වෙන් කිරීම | | | **221,998** | **97,990** |
| ශේෂය ඉ/ගෙ | | | **10** | **11** |

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් ලෙස සටහන් අංක 01 සිට 09 දක්වා පිටු අංක 06 සිට 23 දක්වා ඉදිරිපත් කර ඇත.

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය
## අර්ථසාධක අරමුදල
## 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2022 | | 2021 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **01. හිමිකම්** | | | | |
| දායක ගිණුම | 02 | | 554,166,048 | 501,701,254 |
| | | | **554,166,048** | **501,701,254** |
| **02. සංචිත** | | | | |
| සමුච්චිත ශේෂය | | | 10 | 11 |
| | | | **554,166,058** | **501,701,265** |
| **නියෝජනය කරන්නේ** | | | | |
| **03. දිගුකාලීන වත්කම්** | | | | |
| සේවක ණය | 02 | 123,656,576 | **123,656,576** | 98,660,739 |
| | | | | **98,660,739** |
| **04. ජංගම වත්කම්** | | | | |
| ස්ථාවර තැන්පතු | 03 | 385,985,165 | | 396,196,262 |
| ණයහිමි ආයෝජන | 03 | 2,022,886 | | 1,897,542 |
| ලැබිය යුතු පොලී | 04 | 49,371,765 | | 12,722,750 |
| මුදල් හා මුදල් හා සමාන වත්කම් | 05 | 3,667,100 | | 12,329 |
| | | | **441,046,915** | **410,828,883** |
| **05. අඩු කළා :** | | | | |
| **ජංගම බැරකම්** | | | | |
| උපචිත වියදම් | 06 | 214,200 | | 112,200 |
| විවිධ ණයහිමියෝ | 07 | 3,526,787 | | 6,382,018 |
| ශුද්ධ ණයහිමි ආයෝජන ආදායම සඳහා වෙන් කිරීම | 08 | 591,161 | | 369,162 |
| ගෙවිය යුතු ආදායම් බදු | 09 | 6,205,285 | | 924,977 |
| | | | **10,537,432** | **7,788,357** |
| ශුද්ධ ජංගම වත්කම් | | | **430,509,482** | 403,040,526 |
| | | | **554,166,058** | **501,701,265** |

එම්.ඒ.වී.එස්. ගුණවර්ධන
මූල්‍යාධිකාරී
2023.02.27

ඊ.ඒ. ගුණසේන
ලේඛකාධිකාරී (වැඩ බලන)
2023.02.27

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකීමට යටත් වන අතර පාලක සභාව වෙනුවෙන් පහත අත්සන් තබන ලදි.

මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංස ස්ථවිර
මහෝපාධ්‍යායය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

පාලක සභික

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන හිමි
2. ඩී.කේ.ඩබ්.ඩී.පී. ප්‍රේමරත්න මිය

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය
### අර්ථසාධක අරමුදල
### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සාමාජික ශේෂය<br>රු. | රඳවා ගන්නා ලද ආදායම<br>රු. | මුළු ශුද්ධ වත්කම්<br>රු. |
|---|---|---|---|
| 2019.12.31 දිනට ශේෂය | 359,966,995 | (0) | 359,966,995 |
| වර්ෂයට අදාළ සාමාජික මුදල | 64,071,147 | - | 64,071,147 |
| දායක ගිණුම් සඳහා මුදල් ගෙවීම් | (13,473,355) | - | (13,473,355) |
| සාමාජික පොලිය | 25,616,083 | (25,616,083) | - |
| වර්ෂයේ අතිරික්තය | - | 25,534,713 | 25,534,713 |
| පෙර වර්ෂයේ ගැලපීම | - | 81,381 | 81,381 |
| 2020.12.31 දිනට ශේෂය | **436,180,870** | **11** | **436,180,880** |
| වර්ෂයට අදාළ සාමාජික මුදල | 63,401,449 | - | 63,401,449 |
| දායක ගිණුම් සඳහා මුදල් ගෙවීම් | (16,306,628) | | (16,306,628) |
| සාමාජික පොලිය | 18,425,563 | (18,425,563) | - |
| වර්ෂයේ අතිරික්තය | - | 18,425,563 | 18,425,563 |
| පෙර වර්ෂයේ ගැලපීම | - | | - |
| 2021.12.31 දිනට ශේෂය | **501,701,254** | **11** | **501,701,264** |
| වර්ෂයට අදාළ සාමාජික මුදල | 60,338,580 | - | 60,338,580 |
| දායක ගිණුම් සඳහා මුදල් ගෙවීම් | (55,031,744) | | (55,031,744) |
| සාමාජික පොලිය | 47,157,958 | (47,157,958) | - |
| වර්ෂයේ අතිරික්තය | - | 47,157,957 | 47,157,957 |
| පෙර වර්ෂයේ ගැලපීම | - | | - |
| 2022.12.31 දිනට ශේෂය | **554,166,048** | **10** | **554,166,058** |

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය

### අර්ථසාධක අරමුදල

### 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | | | | |
| මෙහෙයුම් අතිරික්තය (බදු පසු ආදායම) | | 47,379,955 | | 18,523,553 |
| ගැලපීම් පසුගිය වර්ෂය | | | | |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම | | | | |
| ලැබිය යුතු පොලිය | (36,649,015) | | 4,028,929 | |
| උපචිත වියදම් | 102,000 | | (84,360) | |
| ගෙවිය යුතු ආදායම් බදු | 5,280,308 | | (1,243,406) | |
| විවිධ ණයහිමියෝ | (2,855,231) | | 4,834,818 | |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | (34,121,938) | (34,121,938) | 7,535,981 | 7,535,981 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | 13,258,017 | | 18,523,553 |
| ආයෝජන ක්‍රියාකාරකම් | | | | |
| ස්ථාවර තැන්පතු - ආයෝජන | (385,985,165) | | (386,208,512) | |
| ස්ථාවර තැන්පතු - අවලංගු කිරීම් | 396,196,263 | | 312,225,455 | |
| සේවක ණය ගෙවීම් | (44,293,500) | | (15,941,105) | |
| සේවක ණය වාරික ලැබීම් | 19,297,663 | | 15,685,168 | |
| ආයෝජන - ණයහිමි | (125,344) | | (148,655) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (14,910,083) | (14,910,083) | (74,387,649) | (74,387,649) |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | | | |
| දායක ගිණුම්වලින් ලැබීම් | 60,338,580 | | 63,401,449 | |
| දායක ගිණුම් සඳහා මුදල් ගෙවීම් | (55,031,744) | | (16,306,628) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | 5,306,836 | 5,306,836 | 47,094,821 | 47,094,821 |
| මුදල් හා මුදල් සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | 3,654,771 | | (1,233,294) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන විෂයන්ගේ ශේෂය | | 12,329 | | 1,245,623 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන විෂයන්ගේ ශේෂය | | 3,667,100 | | 12,329 |

මූල්‍යාධිකාරී
2023.02.27

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# අර්ථසාධක අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

## 1) ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1.1 වාර්තා කිරීමේ අස්ථිත්වය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර ප්‍රධාන වශයෙන් රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ආයතනයකි.

1981 අංක 74 දරනපනතින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ස්ථාපනය කර ඇති අතර, 1995 අංක 37 දරන (සංශෝධිත) පනතින් සංශෝධනය වී ඇත. මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිට්පන උතුර, ගුරුළුගෝමි මාවතේ පිහිටා ඇති අතර පරිපාලන ගොඩනැගිල්ල හෝමාගම, පිට්පන, මොරගහහේන පාරේ, අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත. තව ද විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 214 දරන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පනත මඟින් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත.

### 1.1.2 ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල

1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පනත මඟින් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලක් පිහිටුවා ඇති අතර, සාමාජිකයන් විශ්‍රාම ගැනීමේ දී හෝ සේවය අවසන් කිරීමේ දී වඩා යහපත් මූල්‍ය ප්‍රතිලාභයක් අත්කර දීම අරමුදලේ ප්‍රධාන අරමුණ වේ.

### 1.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම

(අ) මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම පාලක සභාව විසින් දරන අතර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා පාලක සභාව විසින් 2023 පෙබරවාරි 27 දින අනුමැතිය ලබා දෙන ලදී.

(ආ) මූල්‍ය කාලපරිච්ඡේදය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස 12 ක කාල සීමාවයි.

### 1.1.4 සකස් කිරීමේ පදනම

#### (අ) අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව (SLPSAS) අවසන් ගිණුම් වාර්තා පිළියෙල කොට ඇති අතර අදාළ අවස්ථාවල දී 1971 අංක 38 දරන මුදල් පනත සහ ආයතන සංග්‍රහය ද අදාළ කරගෙන ඇත.

මීට අමතරව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් වරින් වර විශ්වවිද්‍යාලයට අදාළ කරගනු ලබන පහත සඳහන් චක්‍රලේඛන ද ගිණුම් තැබීම සඳහා උපයෝගී කරගෙන ඇත.

* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන සහ රාජ්‍ය මුදල් රෙගුලාසි
* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ
* මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ

#### (අ) අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරීත්වය විසින් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමක දී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතු සිදු කිරීමට අරමුදල සතු සම්පත් පවතින බවට තහවුරු විය. එම නිසා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය සේවක. අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

#### (අ) ගණනය කිරීමේ පදනම

විශේෂයෙන් සඳහන් කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත.

#### (ඈ) මූල්‍ය වාර්තා සකස් කර ඇති මුදල් වර්ගය

අවසන් ගිණුම් සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ භාවිත රුපියල් ශතවලින් වටිනාකම් ගණනය කොට ඇති අතර, ගිණුම් වාර්තා අවසාන රුපියලට වැටයීමට කටයුතු කර ඇත.

#### (ඉ) සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශන පරිශීලනයේ දී වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා හා සැසඳීමේ හැකියාව වර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ පසුගිය ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ තොරතුරු අනාවරණය කර ඇත.

(ඉ) <u>ප්‍රමාණාත්මතාවය හා සමාහරණය</u>

අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ නම් හෝ අසමාන ස්වභාවයේ ඇත්නම් හැර සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම සටහන් ලෙස ඉදිරිපත් කර ඇත.

1.2.1 <u>ආයෝජන හා සේවක ණය</u>

(අ) විශ්වවිද්‍යාලයීය සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයින්ගෙන් ලබා ගන්නා දායකය සහ විශ්වවිද්‍යාලය මඟින් දෙනු ලබන දායකවල මුළු එකතුව මාස්පතා සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට බැර කරනු ලැබේ. මෙම එකතු වන මුදලින් සේවකයන්ට ණය දීම, සේවකයකු විශ්‍රාම යෑම හෝ අස්වීම පදනම් කර ගෙන ඒ අයට ගෙවීමට අවශ්‍ය මුදල් ගිණුමේ ඉතිරි කර අනෙක් මුදල් ආයෝජනය කරනු ලබයි. එසේම ගෙවීම් සඳහා මුදල් රඳවා ගැනීමේ කාල සීමාව අනුව කෙටිකාලීනව සත්දින තැන්පතුවල ද ආයෝජනය කිරීම සිදු කෙරේ.

(ආ) මෙම ආයෝජන ගිණුම්වලින් වර්ෂය තුළදී ලැබෙන ආදායමෙන් අදාළ වියදම් අඩු කොට ඉතිරිය සේවකයන්ගේ දායක අනුපාතයට බෙදා හරිනු ලබයි.

397 වන පාලක සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල පිළිබඳ පාලනය, පරිපාලනය හා කළමනාකරණය සඳහා වූ නියෝග මාලාව අනුව පොලිය ගණනය හා සාමාජිකයින්ට බෙදාහැරීම සිදුවේ. සේවක ණය ලබා දීමේ දී සේවකයින්ගෙන් පොලියක් අය නොකරන අතර, මාසය අවසානයේ දායක ශේෂයෙන් මාසය අවසානයේ ණය ශේෂය අඩු කර ඉතිරි මුදල සඳහා පමණක් වාර්ෂික පොලිය ගණනය කර මාසිකව පොලිය බෙදාහරිනු ලබයි.

2014 වර්ෂය තෙක් පනතට අනුව පොලී ප්‍රතිශතය අමාත්‍යවරයා විසින් නිර්දේශ කර පාලක සභාව විසින් අනුමත කිරීම සිදුවූවත්, 2015 වර්ෂයේ සිට ප්‍රථමයෙන් පාලක සභාව විසින් අනුමත කර ඉන්පසු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සිදු කරනු ලබයි.

1.2.2 <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>

මුදල් ප්‍රවාහ ප්‍රකාශ වක්‍ර ක්‍රමයට පිළියෙළ කර ඇත.

1.2.3 <u>මුදල් හා මුදල්වලට සමාන වත්කම්</u>

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවෙන් යුක්ත කෙටිකාලීන තැන්පතු, මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ.

1.2.4 <u>වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්</u>

මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කර ඇති තොරතුරුවලට ප්‍රමාණාත්මකව බලපාන කිසිදු සිදුවීමක් ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදු වී නොමැත.

1.2.5 <u>ආදායම් බදු</u>

2017 අංක 24 දරන ආදායම් බදු පනතේ ප්‍රතිපාදන අනුව අර්ථසාධක අරමුදලේ ආදායම් බදු වගකීම 14% ක් වේ.

1.2.6 <u>ප්‍රතිපාදන හා වෙන් කිරීම්</u>

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අරමුදලට ප්‍රවර්තන බැඳීමක් පවතින විට එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභවලින් යුතු සම්පත් පිටතට ගලා යාම භව්‍යවන විටෙක හා බැඳීමේ ප්‍රමාණයෙහි විශ්වාසදායී ඇස්තමේන්තුවක් කළ හැකි විටෙක ප්‍රතිපාදනය හඳුනාගනී.

1.3.1 <u>සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකළ ගනුදෙනු</u>

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයින් සමඟ සිදු කළ ගනුදෙනු පහත දැක්වේ. පාලක සභාව විසින් ආයෝජන කමිටුව හා විශේෂ මූල්‍ය කමිටුව සඳහා සාමාජිකයින් පත් කරන ලද අතර විශ්වවිද්‍යාලීය සාමාන්‍ය පරිපාලන කටයුතුවලදී පහත ගනුදෙනු සිදුවී ඇත.

| පාලක සභා සාමාජිකයින්ගේ නම | ගනුදෙනුවේ ස්වාභාවය | වටිනාකම රු. |
|---|---|---|
| ජනාධිපති නීතීඥ ප්‍රශාන්ත ලාල් අල්විස් මහතා | සාමාජික ගාස්තු | 20,000 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා | සාමාජික ගාස්තු සහ ගමන් ගාස්තු | 21,500 |
| ටී.කේ.ඩබ්.ටී.පී. ප්‍රේමරත්න මිය | සාමාජික ගාස්තු සහ ගමන් ගාස්තු | 21,500 |
| **මුළු එකතුව** | | **63,000** |

1.4.1 <u>විගණන ගාස්තු</u>

2016 වර්ෂය වෙනුවෙන් ජාතික විගණන කාර්යයාලය වෙත ගෙවන ලද මුදලින් රු. 14,040.00 ක මුදලක් නැවත ගෙවන ලද අතර එම මුදල ප්‍රවර්තන වර්ෂයේ දී ගලපා ඇත.

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එච්ඊඩී/ඩී/බීපීයූ/එෆ්ඒ/22/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි 19 දින |

මහෝපාධ්‍යායයන් වහන්සේ,

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව හා 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ අංක 38 දරන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 216,860,050 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දී ලැබී තිබූ රු.1,025,338 ක පරිත්‍යාග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 23 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලද වටිනාකම රු.6,750,000 ක් වූ වාහන දෙක ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය තුල දී ද කටයුතු කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදලේ ඉතිරි කිරීමේ තැන්පතු ශේෂය රු.642,020 ක් වුවද ඉතිරි කිරීමේ බැංකු පොත අනුව එම ශේෂය රු.285,480 ක් වූයෙන් රු.356,540 ක නොසැසඳීමක් පැවතුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දැව භාණ්ඩ එකතු කිරීම් රු.1,485,475 ක් වූවද දැව භාණ්ඩ ලෙජරය හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම අගය රු.316,450 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,169,025 ක වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2 | 8

**1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පිටුව 3 | 8

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

පිටුව 4 | 8

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා

5 | 8

විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අ) සහ (ඇ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති/ විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල දී රු. 31,387,500 ක් ආයෝජනය කර තිබුණි. |

6 | 8

(ආ) 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 15 වන වගන්තියේ (VI) ඡේදය

අමාත්‍යවරයා විසින් පත්කල යුතු පාලක සභාවේ සාමාජිකයින් අධ්‍යාපන, මූල්‍ය, නීති සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් වියයුතු වුවද පාලක සභාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ තැනැත්තකු නොසිටි අතර නීති ක්ෂේත්‍රය සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය සිය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථ 04 ක් යටතේ අරමුණු 14 ක් ලඟාකර ගැනීම සඳහා 2022 වර්ෂයේ පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විදේශීය ශිෂ්‍ය ප්‍රජාව වර්ධනය කිරීම, විදේශීය අනුබද්ධ ආයතන ප්‍රවර්ධනය කිරීම හා පශ්චාත් උපාධි හා පර්යේෂණ සඳහා පිරිස් උනන්දු කිරීමේ අරමුණු පරීක්ෂා කිරීමේදී 2021 හා සමාලෝචිත වර්ෂය අවසානයේ දී අපේක්ෂිත විදේශීය ශිෂ්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් 50 දෙනෙකු හා 75 දෙනෙකු වුව ද තත්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් සිසුන් 06 දෙනෙකු හා සිසුන් 18 දෙනෙකු විය. එසේම බාහිර පශ්චාත් පාඨමාලා සඳහා බඳවා ගැනීම් 2021 හා 2022 වර්ෂ සඳහා අපේක්ෂිත සිසුන් පිළිවෙලින් 600ක් හා 6250ක් වුවද තත්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් සිසුන් 1480 දෙනෙකු හා සිසුන් 1559 දෙනෙකු විය. එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් වර්ධනය කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු.190,135,000 ක් වූ (වැට් රහිත) විදේශ සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 11 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී 2022 අගෝස්තු 30 දක්වා දීර්ඝ කර

7 | 8

තිබුණි. 2022 පෙබරවාරි 28 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.148,336,250 ක් ගෙවා තිබුණු අතර 2022 මැයි මාසයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ රු.9,506,750 ක් වූ කාර්යසාධන බැඳුම්කරය 2022 අගෝස්තු 30 දින කල්ඉකුත් වී තිබුණි.

(ඇ) ඇස්තමේන්තු වටිනාකම රු.252,327,545 ක්වූ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා 2019 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත්කරු වෙත රු.14,508,834 ක අත්තිකාරමක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. වසර 3 කට වැඩි කාලයක් පෞද්ගලික කොන්ත්‍රාක්කරුවකු අතරැදී මුදල් 2022 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

8 | 8

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

| විගණන ඡේදය | වර්තමාන ප්‍රගතිය |
|---|---|
| **1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** | |
| අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 216,860,050 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ තක්සේරු කටයුතු ආරම්භ කර ඇති අතර, වාහන තක්සේරුව අවසන් කර ගිණුම්ගත කර ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල දී ලැබී තිබූ රු.1,025,338 ක පරිත්‍යාග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීම හා මැනීම සිදු කර නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවට අතිරේක තොරතුරක් ලෙස ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව සකස් කළ 2022 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කර ඇති අතර ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවට ද ඉදිරිපත් කිරීමට නියමිතය. |
| (ඇ) 2019 දෙසැම්බර් 23 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විශ්ව විද්‍යාලය වෙත පවරා දෙන ලද වටිනාකම රු.6,750,000 ක් වූ වාහන දෙක ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලද වාහන දෙකෙහි ප්‍රත්‍යාගණන වටිනාකම 2023 වර්ෂයේදී ගිණුම්වලට ගෙන ඇත. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදලේ ඉතිරි කිරීමේ තැන්පතු ශේෂය රු.642,020 ක් වුවද ඉතිරි කිරීමේ බැංකු පොත අනුව එම ශේෂය රු.285,480 ක් වූයෙන් රු.356,540ක නොසැසඳීමක් පැවතුණි. | එකඟ නොවේ.<br>විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුමකින් ඉතිරිකිරීමේ ගිණුමට චෙක්පතක් නිකුත් කර ඇති අවස්ථාවක ඊට අදාළ ද්විත්ව සටහන ගිණුම්වලට ඇතුළත් කළ යුතු වේ. එහි දී චෙක්පත නිෂ්කාශණය නොවීම මත මෙවැනි තත්ත්වයක් ඇති වේ. |
| (ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දැව භාණ්ඩ එකතු කිරීම් රු.1,485,475 ක් වුවද දැව භාණ්ඩ ලෙජරය හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම අගය රු. 316,450ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,169,025ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන අගයන් සමඟ ලෙජරයේ අනෙකුත් අදාළ ලේඛන සමාන වී ඇත. |

1

| විගණන ඡේදය | | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| **2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**<br>**2.2.2** | | |
| **නීතිරීති/ විධානයට යොමුව** | **නිරීක්ෂණ** | |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.31,387,500 ක් ආයෝජනය කර තිබුණි. | එකඟ වේ. |
| (ආ) 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 15 වන වගන්තියේ (VI) ඡේදය | අමාත්‍යවරයා විසින් පත්කල යුතු පාලක සභාවේ සාමාජිකයින් අධ්‍යාපන, මූල්‍ය, නීති සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් විය යුතු වුවද පාලක සභාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ තැනැත්තකු නොසිටි අතර නීති ක්ෂේත්‍රය සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. | 2021.01.01 දිනැතිව විශ්වවිද්‍යාලය විසින් මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.<br>කෙසේ වුවද විගණන හා කළමනාකරණ කමිටුව සඳහා වරලත් ගණකාධිකාරීවරයෙකු, වරලත් ගණකාධිකාරී ආයතනය මගින් තෝරා පත්කරගෙන ඇති අතර මුදල් කමිටුවට සහ විගණන හා කළමනාකරණ කමිටුව යන කමිටු දෙකම සඳහා භාණ්ඩාගාර නියෝජිතයන් පත්කර ඇත. |
| **2.3 වෙනත් කරුණු** | | |
| (අ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථ 04ක් යටතේ අරමුණු 14ක් ලඟා කරගැනීම සඳහා 2022 වර්ෂයේ පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විදේශීය ශිෂ්‍ය ප්‍රජාව වර්ධනය කිරීම, විදේශීය අනුබද්ධ ආයතන ප්‍රවර්ධනය කිරීම හා පශ්චාත් උපාධි හා පර්යේෂණ සඳහා පිරිස් උනන්දු කිරීමේ අරමුණු පරීක්ෂා කිරීමේදී 2021 හා සමාලෝචිත වර්ෂය අවසානයේදී අපේක්ෂිත විදේශීය ශිෂ්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් 50 දෙනෙකු හා 75 දෙනෙකු වුව ද සත්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් සිසුන් 06 දෙනෙකු හා සිසුන් 18 දෙනෙකු විය. එසේම බාහිර පශ්චාත් පාඨමාලා සඳහා බඳවා ගැනීම් 2021 හා 2022 වර්ෂ සඳහා අපේක්ෂිත සිසුන් පිළිවෙලින් 600ක් හා 6250ක් වුවද සත්‍ය බඳවා ගැනීම් පිළිවෙලින් සිසුන් 1480 දෙනෙකු හා සිසුන් 1559 දෙනෙකු විය. එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් වර්ධනය කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | | 2022 අධ්‍යයන වර්ෂය සඳහා විදේශීය සිසුන් බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් දැනට අයදුම්පත් 20ක් පමණ විශ්වවිද්‍යාලයට ලැබී ඇති බවත් සඳහන් කරමි.<br>2022 වර්ෂය සඳහා විදේශීය සිසුන් බඳවා ගෙන අදාළ අයදුම්පත්‍රවල කටයුතු අවසන් කර ඇත.<br>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා සංයුක්ත සැලැස්ම අනුව 2021 සහ 2022 වර්ෂ සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් ප්‍රමාණය වූයේ 6250කි. නමුත් දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාවේ 2019 වර්ෂයේ සිසුන් 2046ක් වුවද ඉන්පසු එම |

2

<table>
<tr><th>විගණන ඡේදය</th><th>වර්තමාන ප්‍රගතිය</th></tr>
<tr><td></td><td>පාඨමාලාව කොවිඩ් හේතුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් පවත්වාගෙන යාමට ප්‍රතිපාදන ලබා දී නොමැත. එයට අමතරව අනෙකුත් පාඨමාලා සඳහාද කොවිඩ් තත්ත්වය මත සිසුන් බඳවා ගැනීම අඩු වී ඇත.<br>පශ්චාද් උපාධි පීඨය හා බාහිර විභාග අංශය සඳහා සිසුන් පිළිබඳ තොරතුරු මෙසේ සංශෝධනය විය යුතුය.
<table>
<tr><th colspan="2">2021</th><th colspan="2">2022</th></tr>
<tr><th>අපේක්ෂිත සිසුන් ප්‍රමාණය</th><th>තත්‍ය සිසුන් ප්‍රමාණය</th><th>අපේක්ෂිත සිසුන් ප්‍රමාණය</th><th>තත්‍ය සිසුන් ප්‍රමාණය</th></tr>
<tr><td>6250</td><td>2423</td><td>6250</td><td>3239</td></tr>
</table>
</td></tr>
<tr><td>(ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු. 190,135,000 ක් වූ (වැට් රහිත) විදේශ සිසුන් 200ක් සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 11 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී 2022 අගෝස්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි. 2022 පෙබරවාරි 28 දින වන විට කොන්ත්‍රාත්කරුට රු. 148,336,250ක් ගෙවා තිබුණු අතර 2022 මැයි මාසයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ රු. 9,506,750 ක් වූ කාර්යසාධන බැඳුම්කරය 2022 අගෝස්තු 30 දින කල්ඉකුත් වී තිබුණි.</td><td>මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කොන්ත්‍රාත් ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් එක්ව උසස් අධ්‍යාපන අංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.07.18 දින රැස්වීමක් පවත්වන ලදි.<br><br>ඒ අනුව සාකච්ජා වූයේ කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරියේදී කොන්ත්‍රාත්තුවෙන් ඉවත්වීමේ අවශ්‍යතාවය දැනුම් දීමෙන් පසු ගිවිසුමට අනුව හා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ ක්‍රියාපටිපාටිය පරිදි පාලක සභාවට යොමුකර කොන්ත්‍රාත් ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කරන ලදි. ඉන් අනතුරුව කොන්ත්‍රාත් ව්‍යාපෘතිය වෙනුවෙන් මේ වන විට වැය වූ මුදල් ප්‍රමාණය හැර මෙම ගොඩනැගිල්ල සඳහා මෙම වසරේ ඉතිරි ප්‍රතිපාදන වලින් නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන වාර්ෂික ප්‍රතිපාදන හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් සිදු කිරීමට තීරණය විය. තවද ඉදිරි වර්ෂවල විශ්වවිද්‍යාලයට ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන මත එම කාර්යයන් ඉටුකිරීම තීරණය වූ අතර ඉදිරියේදී ඒ සඳහා පියවර ගැනීමට සිදු කරන බව දන්වා සිටිමි.</td></tr>
<tr><td>(ඇ) - ඇස්තමේන්තු වටිනාකම රු.252,327,545 ක්වූ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත්කරු වෙත රු. 14,508,834 ක අත්තිකාරමක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම්</td><td>කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව කොන්ත්‍රාත් ආයතනයට 5% ක අත්තිකාරම් මුදල් පියවීමට අදාළව උපදෙස් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2023.04.28 දිනැතිව වාර්තාවක් මගින් ඉදිරිපත් කර ඇත.</td></tr>
</table>

3

| විගණන ඡේදය | වර්තමාන ප්‍රගතිය |
|---|---|
| කටයුතු ආරම්භ කර නොතිබුණි. වසර 3 කට වැඩි කාලයක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු අත රැදී මුදල් 2022 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම වාර්තාවට අනුව බිල්පතේ ඇතැම් අයිතමයන් සඳහා ගෙවීම් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර තවත් අයිතමයන්ගෙන් කොටසක් සඳහා ගෙවීම් කිරීම වැඩ ඉංජිනේරු නිර්දේශ කළ යුතු බව දන්වා ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් නැවත ආරම්භ කළහොත් ඊට අදාළව විශ්වවිද්‍යාල්ය වෙත ලබා දී නැති ඉදිරියේදී අවශ්‍ය කරන සැලසුම් ලබාදීමට එකගතාවය පළ කර ගිවිසුමට එළඹීමෙන් පසු ඉල්ලුම් කර ඇති ඉතිරි අත්තිකාරම් ගෙවීම් මුදල් පියවා ගැනීමට හැකි බවද අදාළ වාර්තාවේ දක්වා තිබුණි<br>ඒ අනුව ඉතිරි මුදල් පියවා ගැනීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් වාර්තාවක් 2023.06.20 දින වැඩ ඉංජිනේරු විසින් කොන්ත්‍රාත් ආයතනයට යොමු කරන ලදි. අදාළ වාර්තාව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඇගයීම් කමිටුවට යොමු කර ඇති අතර එහි නිර්දේශ ලැබූ පසු අත්තිකාරම් මුදලේ ඉතිරි මුදල් පියවා ගැනීමට කටයුතු සිදු කරන බවද දන්වා සිටිමි. |

4

# විගණකාධිපති වාර්තාව
# සේවක අර්ථසාධක අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/D/BPU/FU/FA/
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 අප්‍රේල් 11 දින

මහෝපාධ්‍යායයන් වහන්සේ,

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

පිටුව 2 | 4

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

පිටුව 3 | 4

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 29(3) වගන්තිය ප්‍රකාරව දායකයාගේ ගිණුමේ බැරට ඇති මුළු මුදල හා එදින දක්වා එකතු වූ පොළී මුදල ගෙවිය යුතුය. එසේ වුවද 2013 මාර්තු 20 දින සේවය අවසන් කළ නිලධාරියකු සඳහා ගෙවිය යුතු රු.1,547,200 ක් වූ අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සඳහා 2015 වර්ෂයේ ඔහු වෙත යවන ලද චෙක්පත භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ණය හිමියකු වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විශේෂ මූල්‍ය කමිටුවක් මඟින් 2023 ජනවාරි 31 දින මේ සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබුණද 2023 මාර්තු 30 දින වන විට ද මෙම ගැටළුව නිරාකරණය කිරීමට අපොහොසත්වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 4 | 4

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) වන වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණකාධිපති වාර්තාව**

**3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| විගණන ඡේදය | වර්තමාන ප්‍රගතිය |
|---|---|
| 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතෙ 29 (3) වගන්තිය ප්‍රකාරව දායකයාගේ ගිණුමේ බැරව ඇති මුළු මුදල හා පදින දක්වා එකතු වූ පොලී මුදල ගෙවිය යුතුය. එසේ වුවද 2013 මාර්තු 20 දින සේවය අවසන් කළ නිලධාරියකු සඳහා ගෙවිය යුතු රු.1.547.200ක් වූ අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සඳහා 2015 වර්ෂයේ ඔහු වෙත යවන ලද චෙක්පත භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ණය හිමියෙකු වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පත් කළ විශේෂ මූල්‍ය කමිටුවක් මගින් 2023 ජනවාරි 31 දින මේ සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබුණ ද 2023 මාර්තු 30 දින වන විටද මෙම ගැටළුව නිරාකරණය කිරීමට අපොහොසත් වී තිබුණි. | පී.පයතිස්ස මහතා විසින් ඉල්ලා සිටින ලද විස්තරාත්මක තොරතුරු 2023.07.12 දින ලියාපදිංචි තැපැල මගින් යොමු කරන ලදි. |

2023/08/0

1

වාර්ෂික වාර්තාව 2022